PGIE
POST GRADUATE INSTITUTE OF ENGLISH

# පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය

## ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

# වාර්ෂික වාර්තාව සහ වාර්ෂික ගිණුම්

# 2011

# පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය

## වාර්ෂික වාර්තාව සහ ගිණුම්

## 2011

## අන්තර්ගතය


1. **දැක්ම**

2. **මෙහෙවර**

3. **අධ්‍යක්ෂ සහ ජ්‍යෙෂ්ඨ කළමනාකරණය පිළිබඳ කෙටි විග්‍රහයක්**

   **(අ) පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ සාමාජිකයෝ**

   (i) කළමනාකරණ මණ්ඩලය

   (ii) දෙවන බසක් ලෙස ඉංග්‍රීසි ඉගැන්වීම පිළිබඳ අධ්‍යයන මණ්ඩලය

   (iii) ඉංග්‍රීසි සාහිත්‍යය ඉගැන්වීම පිළිබඳ අධ්‍යයන මණ්ඩලයේ සාමාජිකයෝ

4. **අධ්‍යක්ෂ සමාලෝචනය**

   (අ) කෙටි හැඳින්වීම

   (ආ) ජයග්‍රහණයන්

   (ඇ) අසමර්ථ්‍යයන් හා සනාථ කිරීම

   (ඈ) අනාගත සැලසුම්

5. **අධ්‍යක්ෂ වාර්තාව**

6. **සංශෝධිත මූල්‍ය ප්‍රකාශය** (නව සැකැසුම අනුව)

7. **විගණන කමිටු වාර්තාව**

8. **විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශය**

9. **විගණකාධිපතිවරයාගේ වාර්තාව**

## 10. විගණකාධිපතිවරයාගේ වාර්තාවට පිළිතුරු


## 1. දැක්ම

වෙනස්වන අවශ්‍යතාවලට මුහුණදීමට දිවයින පුරා වෘත්තීමය හා ශික්ෂණ විද්‍යාත්මක කුශලතා වර්ධනය කරමින් ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ හා ඉංග්‍රීසි අධ්‍යාපනයේ අධ්‍යයන උත්කෘෂ්ටතාව සහ පර්යේෂණ පිළිබඳ කීර්තිමත් නායකයෙකු වීම.

## 2. මෙහෙවර

පාණ්ඩිත්‍යය හා පර්යේෂණ තුළින් ද ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ හා ඉංග්‍රීසි අධ්‍යාපනයේ ජාතික ප්‍රතිපත්ති වර්ධනය කිරීම හා ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් බලපෑම් ඇතිකිරීම මගින් හා ජාතික මට්ටමින් ඉංග්‍රීසි අධ්‍යාපනයට නව මෙහෙයවීමක් ලබාදීමෙන් ද පශ්චාද් උපාධි මට්ටමේ ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ හා ඉංග්‍රීසි අධ්‍යාපනයේ උත්කෘෂ්ටතාව සඳහා අවස්ථා සැලසීම හා ආධාර කිරීම.

## 3. අධ්‍යක්ෂ හා ජ්‍යෙෂ්ඨ කළමනාකරණය පිළිබඳ කෙටි විග්‍රහයක්



## (අ) (i) පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ කළමනාකරණ මණ්ඩලයේ සාමාජිකයෝ

| | නම | තනතුර |
|---|---|---|
| 1 | මහාචාර්ය එම්. චන්ද්‍රසේකර මිය<br><br>මහාචාර්ය කාලෝ ෆොන්සේකා මහතා | සභාපති - ඉංග්‍රීසි පිළිබඳ ස්ථාවර කමිටුව (2011.06.14 සිට)<br><br>සභාපති, ඉංග්‍රීසි පිළිබඳ ස්ථාවර කමිටුව (2011.04.05 දක්වා) |
| 2 | ආචාර්ය එච්.වී.එම්. රත්වත්ත මිය<br><br>මහාචාර්ය ආර්. රහීම් මෙය | වැඩ බලන අධ්‍යක්ෂ<br>පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය<br>(2011.03.01 දින සිට)<br><br>අධ්‍යක්ෂ<br>පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය<br>(2011.02.28 දින දක්වා) |
| 3 | ආචාර්ය ජේ. මනතුංග මයා | අංශ ප්‍රධාන/ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ මධ්‍යස්ථානය, මොරටුව විශ්වවිද්‍යාලය |
| 4 | මහාචාර්ය ජී. ඩී. ලේකම්ගේ මිය | පීඨාධිපති/අධ්‍යාපන පීඨය, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය<br>(විවෘත විශ්වවිද්‍යාලයීය සනාතන සභා නියෝජිත) |
| 5 | මහාචාර්ය එස්. වෝල්ටර් පෙරේරා මයා | ඉංග්‍රීසි පිළිබඳ මහාචාර්ය, ඉංග්‍රීසි අධ්‍යයනාංශය, පේරාදෙණිය විශ්ව විද්‍යාලය |
| 6 | මහාචාර්ය නෙලුකා සිල්වා මෙය | අංශ ප්‍රධාන/ඉංග්‍රීසි අධ්‍යයනාංශය, කොළඹ විශ්වවිද්‍යාලය |
| 7 | ආචාර්ය ඩී. මෙන්ඩිස් මෙය | ඉංග්‍රීසි පිළිබඳ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, කොළඹ විශ්වවිද්‍යාලය |
| 8 | වී. සුන්තරේසන් මයා | අංශ ප්‍රධාන/ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ ඒකකය, යාපනය විශ්වවිද්‍යාලය |
| 9 | ආචාර්ය ඩී. දේවේන්ද්‍ර මිය<br><br>ආචාර්ය කේ වර්ණපාල මෙය | අංශප්‍රධාන/භාෂා අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය<br><br>වැඩ බලන අංශ ප්‍රධාන |
| 10 | ආචාර්ය එස්. ජේ. නවරත්න මයා<br><br>එස්. පී. එම්. කේ. සිරිවර්ධන මිය | ලේකම්, උසස් අධ්‍යාපන අමාත්‍යාංශය (2010.08.01 දක්වා)<br><br>ප්‍රධාන ගණකාධිකාරී, (උසස් අධ්‍යාපන අමාත්‍යංශයේ ලේකම් |

| | | |
|---|---|---|
| | | නියෝජනය)<br>(2011.08.09 දින සිට) |
| | **නම** | **තනතුර** |
| 11 | මහාචාර්ය එන්. ආර්. අර්ථනායක මයා<br><br><br>ඒ. රණවීර මයා | ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ පාලක සභා නියෝජිත<br>(2011.08.26 දින සිට)<br><br>ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ පාලක සභා නියෝජිත<br>(2011.06.14 දක්වා) |
| 12 | සී. ද සිල්වා මයා | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය/සංඛ්‍යානය හා පරිගණක විද්‍යා අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය |
| 13 | ආචාර්ය ජී.කොඩිතුවක්කු මයා<br><br><br>එස්. අටුගොඩ මයා | වැඩ බලන සහකාර අධ්‍යක්ෂ ජනරාල්/ භාෂා මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය, ජාතික අධ්‍යාපන ආයතනය<br>(2011.06.20 දක්වා)<br><br>අධ්‍යක්ෂ/ඉංග්‍රීසි අධ්‍යයනාංශය, ජාතික අධ්‍යාපන ආයතනය<br>(2011.06.20 දක්වා) |
| 14 | ආචාර්ය එච්.වී.එම්. රත්වත්ත මිය | දෙවන බසක් ලෙස ඉංග්‍රීසි ඉගැන්වීම පිළිබඳ අධ්‍යයන මණ්ඩලයේ නියෝජිත (2011.01.01 දින සිට) |
| 15 | දිලිනි වලිසුන්දර මෙය | අධ්‍යයනාංශ ප්‍රධාන/<br>ඉංග්‍රීසි අධ්‍යයනාංශය,<br>ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය |
| 16 | එච්.එම්.එන්.එස්. ගුණවර්ධන මිය | අධ්‍යක්ෂ ජෙනරාල්,<br>නීති කටයුතු දෙපාර්තමේන්තුව,<br>(මහාභාණ්ඩාගාරයේ නියෝජිත) |

## (ii) පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ දෙවන බසක් ලෙස ඉංග්‍රීසි ඉගැන්වීම පිළිබඳ අධ්‍යයන මණ්ඩලයේ සාමාජිකයෝ

| | නම | තනතුර |
|---|---|---|
| 1 | ආචාර්ය එච්.වී.එම්. රත්වත්ත මිය<br><br>මහාචාර්ය ආර්. රහීම් මෙය | සභාපති, වැඩ බලන අධ්‍යක්ෂ/ පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය (2011.03.01 දින සිට)<br><br>සභාපති, අධ්‍යක්ෂ/පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය (2011.02.28 දින දක්වා) |
| 2 | මහාචාර්ය එම්. ගුණසේකර මෙය | ඉංග්‍රීසි පිළිබඳ මහාචාර්ය,<br>කැලණිය විශ්වවිද්‍යාලය |
| 3 | ආචාර්ය රධිකා ද සිල්වා මෙය | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය/<br>භාෂා අධ්‍යයනාංශය,<br>ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය |
| 4 | ආචාර්ය වී.වී. මැදවත්තේගෙදර මිය | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය/<br>භාෂා අධ්‍යයනාංශය,<br>ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය |
| 5 | ආචාර්ය ඩබ්. එම්. සෙනෙවිරත්න මිය<br><br>එච්.පී.එස්.ඩී. ගුණසේකර මිය | පුස්තකාලයාධිපති,<br>ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය<br><br>වැඩ බලන පුස්තකාලයාධිපති,<br>ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය<br>(2011.04.21 සිට 2011.09.22 දක්වා) |
| 6 | එල්. කුමාරණතුංග මිය | ආරාධිත දේශක, පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය |
| 7 | පී. නාගසුන්දරම් මෙය | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය (විශ්‍රාමික)<br>ඉංග්‍රීසි අධ්‍යයනාංශය,<br>ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය |
| 8 | එච්. ඩී. විජේසේකර මිය<br><br>අයි. එන්. ජේ. බෝගමුව මිය | ශිෂ්‍ය නියෝජිත<br>(2011.05.26 දින සිට)<br><br>ශිෂ්‍ය නියෝජිත<br>(2011.04.21 දින දක්වා) |
| 9 | එස්. ක්‍රිෂ්ණමූර්ති මයා<br><br>එස්. ආර්. ඉලංගකෝන් මිය | ශිෂ්‍ය නියෝජිත<br>(2011.05.26 දින සිට)<br><br>ශිෂ්‍ය නියෝජිත<br>(2011.04.21 දින දක්වා) |

## (iii) පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ ඉංග්‍රීසි සාහිත්‍යය ඉගැන්වීම පිළිබඳ අධ්‍යයන මණ්ඩලයේ සාමාජිකයෝ

| | නම | තනතුර |
|---|---|---|
| 1 | ආචාර්ය එච්.වී.එම්. රත්වත්ත මිය<br><br>මහාචාර්ය ආර්. රහීම් මෙය | සභාපති, වැඩ බලන අධ්‍යක්ෂ/ පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය (2011.03.01 දින සිට)<br><br>සභාපති, අධ්‍යක්ෂ/පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය (2011.02.28 දින දක්වා) |
| 2 | මහාචාර්ය නෙලුෆර් ද මෙල් මිය | ඉංග්‍රීසි පිළිබඳ මහාචාර්ය,<br>ඉංග්‍රීසි අධ්‍යයනාංශය,<br>කොළඹ විශ්වවිද්‍යාලය |
| 3 | මහාචාර්ය නෙලුකා සිල්වා මෙය | අධ්‍යයනාංශ ප්‍රධාන,<br>ඉංග්‍රීසි අධ්‍යයනාංශය,<br>කොළඹ විශ්වවිද්‍යාලය |
| 4 | මහාචාර්ය මෛත්‍රී වික්‍රමසිංහ මිය | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය/<br>ඉංග්‍රීසි අධ්‍යයනාංශය,<br>කැලණිය විශ්වවිද්‍යාලය |
| 5 | ආචාර්ය දිනලි දේවේන්ද්‍ර මිය | අධ්‍යයනාංශ ප්‍රධාන,<br>භාෂා අධ්‍යයනාංශය,<br>ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය |
| 6 | ආචාර්ය කේ. වර්ණපාල මිය | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය,<br>භාෂා අධ්‍යයනාංශය,<br>ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය |
| 7 | ආචාර්ය ලක්ෂ්මි ද සිල්වා මිය | හිටපු ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය,<br>ඉංග්‍රීසි අධ්‍යයනාංශය,<br>කොළඹ විශ්වවිද්‍යාලය |
| 8 | ආචාර්ය ඩබ්.එම්. සෙනෙවිරත්න මිය | පුස්තකාලයාධිපති,<br>ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය |

## 4. අධ්‍යක්ෂ සමාලෝචනය

### (අ) කෙටි හැඳින්වීම

2011 වර්ෂයේ දී පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ කළමනාකරණ මණ්ඩලය සඳහා නව සභාපතිනියක් සහ සාමාජික මණ්ඩලයක් පත් කෙරිණි. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් නව සාමාජිකයන් දෙදෙනෙකු තෝරා පත් කර දීම ද සිදු විය. ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ පාලක සභාව විසින් කළමනාකරණ මණ්ඩලය සඳහා නව සාමාජිකයෙකු නම් කරන ලද අතර දෙවන බසක් ලෙස ඉංග්‍රීසි ඉගැන්වීම පිළිබඳ අධ්‍යයන මණ්ඩලය මගින් එක් සාමාජිකයෙකු තෝරා පත් පත් කරගන්නා ලදී. මහාචාර්ය කාලෝ ෆොන්සේකා මහතා විසින් දරන ලද කළමනාකරණ මණ්ඩලයේ සභාපති ධුරය මහාචාර්ය මල්කාන්ති චන්ද්‍රසේකර මහත්මිය වෙත හිමිවිය. ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය පාලක සභාව නියෝජනය කරමින් කළමනාකරණ මණ්ඩලයේ සාමාජිකත්වය දැරූ ආර්.ඒ.ඒ. රණවීර මහතා වෙනුවට මහාචාර්ය රංජිත් අර්ථනායක මහතා පත්විය.

2011 වර්ෂයේ දී පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ අර්ධ කාලීන වැඩ බලන කාර්ය මණ්ඩලයක් මගින් සම්පූර්ණයෙන්ම පාලනය වීම සිදු විය. ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ අධ්‍යයන හා පරිපාලන කාර්ය මණ්ඩලය විසින් ඔවුන්ට නියමිත ස්ථිර තනතුරුවල රාජකාරි කටයුතු ඉටු කරන අතරතුර දී ම පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ රාජකාරි කටයුතු ඉටු කරන ලදී.

පූර්ණකාලීන පරිපාලන නිලධාරීන්ගේ සහ අධ්‍යයන කාර්ය මණ්ඩලයේ හිඟය හේතුවෙන් සැලසුම් කරන ලද ක්‍රියාදාමයන් ක්‍රියාත්මක කිරීම ප්‍රබල ලෙස අඩපණ විය.

අධ්‍යයන කාර්ය මණ්ඩලය සම්බන්ධයෙන් බලන කල 2011 නොවැම්බර් මස දී එක් ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයෙකු (ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II ශ්‍රේණිය) වැඩ බාරගත්තේය.

පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ ස්ථිර කාර්ය මණ්ඩලයේ හිඟය හේතුවෙන් එක් නව වැඩසටහනක් පමණක් ආරම්භ කිරීමට හැකියාව ලැබුණි. (දෙවන බසක් ලෙස ඉංග්‍රීසි ඉගැන්වීම පිළිබඳ පශ්චාද් උපාධි ඩිප්ලෝමාව) එමෙන්ම දෙවන බසක් ලෙස ඉංග්‍රීසි ඉගැන්වීම පිළිබඳ ශාස්ත්‍රපති උපාධි පාඨමාලාවේ අධ්‍යයන කටයුතු අඛණ්ඩව සිදුවිය.

පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය සඳහා ස්ථිර ගොඩනැගිල්ලක් ඉදිකිරීම පිළිබඳ යෝජනාව 2011 වර්ෂයේ දී ඉදිරිපත් කරන ලද අතර එය විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මඟින් ප්‍රතික්ෂේප කෙරිණි. ඊට හේතු වශයෙන් දක්වා ඇත්තේ මෙම ආයතනයෙහි ප්‍රධාන තනතුරු වන අධ්‍යක්ෂ, ජ්‍යේෂ්ඨ සහකාර ලේඛකාධිකාරි සහ සහකාර මූල්‍යාධිකාරි යන තනතුරු සියල්ලක්ම අර්ධකාලීන වැඩබලන නිලධාරීන් මඟින් ආවරණය වීමයි.

**(ආ) ජයග්‍රහණයන්**

2011 වර්ෂයේ දී දෙවන බසක් ලෙස ඉංග්‍රීසි ඉගැන්වීම පිළිබඳ ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව සිසුන් හය (06) දෙනෙකු විසින් නිම කරන ලද අතර 2011 දෙසැම්බර් මස පවත්වනු ලැබූ උපාධි ප්‍රදානෝත්සවයේ උපාධි හිමි කරගන්නා ලදී. මෙම ශිෂ්‍යයන් විසින් සිදුකරන ලද පර්යේෂණයන්හි ගුණාත්මකභාවය පිළිබඳව බොහෝ බාහිර නිබන්ධ පරීක්ෂකවරුන් විසින් ඇගයීමට ලක්කොට තිබුණි.

2011 වර්ෂයේ දී පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය දෙවන බසක් ලෙස ඉංග්‍රීසි ඉගැන්වීම පිළිබඳ පශ්චාද් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව ආරම්භ කෙරිණි. දෙවන බසක් ලෙස ඉංග්‍රීසි ඉගැන්වීම පිළිබඳ පශ්චාද් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව සහ එහි ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව සඳහා නවක සිසුන් බඳවා ගැනීම සඳහා 2011 මැයි මස දී දැන්වීම් පළ කෙරිණි.

සකස් කරන ලද අයදුම්පත් සියය (100) අතරින් 94 ක් නිකුත් විය. ඒ අතරින් ද බඳවා ගැනීමේ පරීක්ෂණය අනුව සිසුන් 42 ක් පාඨමාලාවට ඇතුළත් කර ගැනීම සඳහා සුදුසුකම් සපුරා තිබුණි. සිසුන් 37 දෙනෙකු දෙවන බසක් ලෙස ඉංග්‍රීසි ඉගැන්වීම පිළිබඳ ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව සඳහා නැවත ලියාපදිංචි විය.

2011 වර්ෂය තුළ දී පර්යේෂණ ආරම්භ කරන ලද සිසුන් පස් (05) දෙනෙක් ඔවුන්ගේ ස්වාධීන නිබන්ධනයට අදාළ පර්යේෂණ කටයුතුවල නිරත වූහ. වසර අවසාන වන විට පාඨමාලාවේ ලිඛිත විෂයන් අවසන් කරන ලද තවත් සිසුන් අට (08) දෙනෙක් පර්යේෂණ කටයුතු ඇරඹූහ.

2005/2006, 2006/2007 අධ්‍යයන වර්ෂයන්හි දී ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව සඳහා ලියාපදිංචි වූ සිසුන් අතරින් තිදෙනෙක් පෞද්ගලික හේතු මත පාඨමාලාව අතරමඟ නතර කර දැමීය. ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව සඳහා නැවත ලියාපදිංචිය මේ අනුව විවෘත සහ දූරස්ථ අධ්‍යාපන ක්‍රමයේ අභිමතාර්ථ "තම අභිමතය පරිදි තෝරාගත් ස්ථානයක සිට අභිමත කලක දී අධ්‍යාපනය හැදෑරීම යන" දර්ශනයේ පිහිටා ඉටු කරලීමට සමත්විය.

ශාස්ත්‍රපති උපාධි පාඨමාලාවේ සහ පශ්චාද් උපාධි ඩිප්ලෝමා පාඨමාලාවේ නවක සිසුන් ලියාපදිංචි කිරීමත් සමඟ ආයතනයේ අපේක්ෂිත ආදායම් තත්ත්වය වර්ධනය විය. පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය යෝජිත දෙවන භාෂා පසුබිම තුළ ඉංග්‍රීසි සාහිත්‍යය ඉගැන්වීම පිළිබඳ පශ්චාද් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව සහ එහි ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව පිළිබඳ අදහසින් යුතුව වර්ෂයේ දෙවන අර්ධයේ දී සැලසුම් සකස් කරන ලදී.

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව නමින් පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ එතෙක් පැවති සහකාර ලේඛකාධිකාරී තනතුර අදාළ වගකීම් සහිත තනි පරිපාලන නිළධාරියෙකු ලෙස දැරීමට සිදුවන වගකීම් සහ වැඩ කොටස සැලකිල්ලට ගෙන ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී තනතුර දක්වා උසස් කරන ලදී.

2011 නොවැම්බර් මස දී පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ ප්‍රථම ස්ථිර අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයා ලෙස ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II ශ්‍රේණියෙහි ආචාර්ය එච්. එස්. රඹුක්වැල්ල මහතා වැඩ බාර ගත්තේය. අනෙක් ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය තනතුරු දෙක සඳහා පුවත්පත් දැන්වීම් පළ කරන ලද අතර 2011 අගෝස්තු මස දී සුදුස්සන් තේරීම සිදු විය. සුදුස්සන් බඳවා ගැනීම සඳහා ආයතනය විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා අනුමැතිය අපේක්ෂාවෙන් සිටියි.

**(ආ) අසමර්ථ්‍යයන් හා සනාතනය**

2011 වර්ෂයේ දී ස්ථිර ප්‍රධාන පරිපාලන තනතුරු දෙක වන ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී සහ සහකාර මූල්‍යාධිකාරී යන තනතුරු නොපිරවීම හේතුවෙන් ආයතනයේ පරිපාලන කටයුතු තදබල ලෙස අකර්මන්‍ය විය. ඉදිරි වර්ෂ පහක කාලය සඳහා වන සංයුක්ත සැලසුම (Corporate Plan) සැකසීම හා අනෙකුත් පරිපාලනමය කටයුතු සැලසුම් කළ පරිදි නිම කිරීමට හැකියාව නොලැබුණි.

පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ අර්ධකාලීන වැඩ බලන ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරීවරු තිදෙනෙක් අඛණ්ඩව කටයුතු කළ අතර වැඩ බලන සහකාර මූල්‍යාධිකාරීවරු දෙදෙනෙක් ද සේවය කොට ඇත.

සලකා බලන වර්ෂය තුළ පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය මුහුණ පෑ අනෙක් දුෂ්කරතාව වන්නේ ආයතනයේ අධ්‍යක්ෂ තනතුර පිරවීම පිළිබඳ අස්ථාවර තත්ත්වයයි.

ආයතනය විසින් මුහුණපාන ලද අපහසුතාවන් සමූහය මෙම ආයතනයේ සමාරම්භය වන 2006 වසරේ සිට දක්නට ලැබෙන ඒවා වෙයි. මීට හේතු සාධක වශයෙන් දක්නට ලැබෙන තත්ත්වයන් ආයතනයේ පාලනයෙන් බැහැර කරුණු වන පුරප්පාඩු පිරවීම, තනතුරු සඳහා අනුමැතිය ලබා ගැනීම, පරිපාලනමය ගැටලු සහ කාර්යාලයීය පරිශ්‍රය පිළිබඳ ගැටලු ආදියයි. විවෘත විශ්වවිද්‍යාලයීය පාලක සභාව විසින් මහාචාර්ය ඩබ්.අයි. සිරිවීර, මහාචාර්ය එච්.පී.එම්. ගුණසේන ඇතුළු පාලක සභා සමාජිකයන්ගෙන් සමන්විත අනු කමිටුවක් පත් කරන ලද අතර ඒ මඟින් පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය මුහුණපාන ප්‍රශ්න පිළිබඳව සොයා බලා වාර්තාවක් ඉදිරිපත් කිරීම නිර්දේශ විය. එම වාර්තාව මෙහි පිටු අංක 26 අනුව අමුණා ඇත.

අදාළ වාර්තාව 2011.06.24 දින ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය පාලක සභාව වෙත ඉදිරිපත් කරන ලදී. එමගින් අනාවරණය වූ කරුණු සලකා බලා එය පාලක සභාව විසින් පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ කළමනාකරණ මණ්ඩලය වෙත යොමු කරන ලදී. එය 2011.08.09 දින පැවති 40 වන කළමනාකරණ මණ්ඩල රැස්වීමේ දී සලකා බලන ලදී. ඒ අනුව එම වාර්තාව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසම වෙත ඉක්මන් ක්‍රියාමාර්ග සඳහා යොමු කෙරිණ. මේ සම්බන්ධයෙන් කළමනාකරණ මණ්ඩලයේ අදහස වූයේ මේ ප්‍රශ්නවලට විසඳුම් ලබා දෙන තුරු පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය අධ්‍යයනමය අංශයෙන් මෙන් එහි ශක්‍යතාව අතින් ඉදිරියට ගමන් කළ හැකි තත්ත්වයක නොපවතින බවයි.

පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය සඳහා ගොඩනැගිල්ලක් ඉදිකිරීම පිළිබඳ යෝජනාව 2011 අගෝස්තු මස දී විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂම වෙත ඉදිරිපත් කරන ලදී. මෙය විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂම විසින් ප්‍රතික්ෂේප කරන ලද්දේ ආයතනයේ සියලු ප්‍රධාන තනතුරු (අධ්‍යක්ෂ, ජ්‍යෝෂ්ඨ සහකාර ලේඛකාධිකාරි සහ සහකාර මූල්‍යාධිකාරි) අර්ධකාලීන වැඩ ආවරණය කරන නිලධාරීන් මඟින් ක්‍රියාත්මක වීම හේතුවෙනි.

**(ඇ) අනාගත සැලසුම්**

1. දෙවන භාෂා පරිසරය තුළ ඉංග්‍රීසි සාහිත්‍යය ඉගැන්වීම පිළිබඳ පශ්චාද් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව සඳහා අවශ්‍ය අංශයන් වෙතින් අනුමැතිය ලබා ගැනීම. (අධ්‍යයන මණ්ඩලය, කළමනාකරණ මණ්ඩලය, සනාතන සභාව, පාලක සභාව සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ඉංග්‍රීසි පිළිබඳ ස්ථාවර කමිටුව හා පශ්චාද් උපාධි අධ්‍යයන හා පර්යේෂණ ස්ථාවර කමිටුව යන අංශයන් වෙතින්)

2. දෙවන භාෂා පරිසරය තුළ ඉංග්‍රීසි සාහිත්‍යය ඉගැන්වීම පිළිබඳ ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව සඳහා අවශ්‍ය අංශයන් වෙතින් අනුමැතිය ලබා ගැනීම. (අධ්‍යයන මණ්ඩලය, කළමනාකරණ මණ්ඩලය, සනාතන සභාව, පාලක සභාව සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ඉංග්‍රීසි පිළිබඳ ස්ථාවර කමිටුව හා පශ්චාද් උපාධි අධ්‍යයන හා පර්යේෂණ ස්ථාවර කමිටුව යන අංශයන් වෙතින්)

3. අදාළ අංශයන් වෙතින් ඉහත සඳහන් පාඨමාලා සඳහා නීති රීති සැකසීමට අදාළ අනුමැතිය ලබා ගැනීම.

4. අධ්‍යයන කාර්ය මණ්ඩලය බඳවා ගැනීම.

5. දෙවන භාෂා පරිසරය තුළ ඉංග්‍රීසි සාහිත්‍ය ඉගැන්වීම පිළිබඳ පශ්චාද් උපාධි ඩිප්ලෝමා/ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව සඳහා ඉගෙනුම් සම්පත් සකසා ගැනීම. (මුද්‍රිත/ශ්‍රව්‍ය/දෘශ්‍ය/මාර්ග ගත)

6. විචාරාත්මක අධ්‍යයනය හා සාහිත්‍යය පිළිබඳ මූලික සංකල්ප පිළිබඳ කෙටි කාලීන පාඨමාලා හඳුන්වා දීම.

**(ඉ) සම්පත් හා ශිෂ්‍ය තොරතුරු**

| **ආයතනය** | **පාඨමාලාව** | **සමස්ත ශිෂ්‍ය සංඛ්‍යාව** | **සමස්ත අධ්‍යයන කාර්ය මණ්ඩලය** | **සමස්ත අනධ්‍යයන කාර්ය මණ්ඩලය** |
|---|---|---|---|---|
| පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය (PGIE) | දෙවන බසක් ලෙස ඉංග්‍රීසි ඉගැන්වීම පිළිබඳ ශාස්ත්‍රපති පාඨමාලාව (MA in TESL) | 37 | 01 (ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයා වැඩ බාර ගන්නා ලද්දේ 2011.11.01 දිනදීය.) | 03 |
| | දෙවන බසක් ලෙස ඉංග්‍රීසි ඉගැන්වීම පිළිබඳ පශ්චාද් උපාධි ඩිප්ලෝමා/ ශාස්ත්‍රපති පාඨමාලාව (PG Dip./MA in TESL) | **25** | | |
| **එකතුව** | **02** | **62** | **01** | **03** |

(ඊ) දේශීය ශිෂ්‍ය තොරතුරු

| ආයතනය | පාඨමාලාව | මාධ්‍යය | 2010 ශිෂ්‍ය කණ්ඩායම | පළමු වසර ශිෂ්‍යයන් | දෙවන වසර ශිෂ්‍යයන් | උපාධිය සමත් වූ සිසුන් |
|---|---|---|---|---|---|---|
| පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය | දෙවන බසක් ලෙස ඉංග්‍රීසි ඉගැන්වීම පිළිබඳ ශාස්ත්‍රපති පාඨමාලාව | ඉංග්‍රීසි | - | 21 | 16 | 06 |
| | දෙවන බසක් ලෙස ඉංග්‍රීසි ඉගැන්වීම පිළිබඳ පශ්චාද් උපාධි ඩිප්ලෝමා/ ශාස්ත්‍රපති පාඨමාලාව | ඉංග්‍රීසි | **25** | **-** | **-** | **-** |
| **මුළු ගණන** | | | **25** | **21** | **16** | **06** |

(උ) අධ්‍යයන කාර්ය මණ්ඩලය පිළිබඳ තොරතුරු

| ආයතනය | විෂය | මාධ්‍යය | ජ්‍යෙෂ්ඨ මහාචාර්ය | මහාචාර්ය | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය | කථිකාචාර්ය | ආධුනික කථිකාචාර්ය | උපදේශක |
|---|---|---|---|---|---|---|---|---|
| පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතන ය | - | ඉංග්‍රීසි | - | - | 01 | - | - | - |
| **මුළු ගණන** | **-** | **-** | **-** | **-** | **01** | **-** | **-** | **-** |

(ඌ) අනධ්‍යයන කාර්ය මණ්ඩලය පිළිබඳ තොරතුරු

| ආයතනය | ජ්‍යෙෂ්ඨතම කාර්ය මණ්ඩලය | ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩලය | කනිෂ්ඨ කාර්ය මණ්ඩලය | සුළු සේවක |
|---|---|---|---|---|
| පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය | - | - | 02 | 01 |
| **මුළු ගණන** | **-** | **-** | **02** | **01** |

**(එ) පර්යේෂණ නව සොයාගැනීම් සහ ප්‍රකාශන පිළිබඳ තොරතුරු**

| **විෂය** | **ප්‍රකාශිත** | **මුද්‍රිත** | **ඉදිරිපත් කිරීම්** |
|---|---|---|---|
| (අ) පර්යේෂණ | - | - | 01 |
| (ආ) නව සොයාගැනීම් | - | - | - |
| (ඇ) වාර සඟරා | - | - | - |
| (ඈ) පොත් | 04 | - | - |
| (ඉ) ශාස්ත්‍රීය ලිපි | 01 | - | - |
| (ඊ) වෙනත් | - | - | - |
| **මුළු ගණන** | **05** | **-** | **01** |

**(ඒ) වැඩසටහන්, සම්මන්ත්‍රණ හා වැඩමුළු පිළිබඳ තොරතුරු**

| **විෂය** | **සහභාගිවීම්** | **සම්පූර්ණ කරන ලද** | **මෙහෙයවන ලද** |
|---|---|---|---|
| (අ) පශ්චාද් උපාධි පාඨමාලා | - | - | 01 |
| (ආ) පශ්චාද් උපාධි ඩිප්ලෝමා පාඨමාලා | - | - | 01 |
| (ඇ) උපාධි පාඨමාලා | - | - | - |
| (ඈ) ඩිප්ලෝමා පාඨමාලා | - | - | - |
| (ඉ) සහතිකපත්‍ර පාඨමාලා | - | - | - |
| (ඊ) වෙනත් | - | - | - |
| මුළු ගණන | - | - | 02 |

**(ඓ) ආරම්භ කරන ලද නව පාඨමාලා පිළිබඳ තොරතුරු**

| **ආයතනය** | **පාඨමාලාව** | **මාධ්‍යය** | **සහතික පත්‍ර** | **ඩිප්ලෝමා** | **පශ්චාද් උපාධි ඩිප්ලෝමා** | **ශාස්ත්‍ර පති** | **දර්ශන පති** | **දර්ශන සූරි** |
|---|---|---|---|---|---|---|---|---|
| පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය (PGIE) | දෙවන බසක් ලෙස ඉංග්‍රීසි ඉගැන්වීම පිළිබඳ පශ්චාද් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව | ඉංග්‍රීසි | - | - | පශ්චාද් උපාධි ඩිප්ලෝමා | - | - | - |
| **එකතුව** | 01 | | - | 01 | - | - | - | - |

**(ඔ) මෙම වාර්තාවට අදාළ වෙනත් තොරතුරු/ක්‍රියාකාරීත්වයන්**

පශ්චාද් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව 2011 ඔක්තෝම්බර් මස දී ආරම්භ කරනු ලැබූ අතර ශිෂ්‍යයන් 25 දෙනෙකු ඇතුළත් කරනු ලැබිණි. දෙවන බසක් ලෙස ඉංග්‍රීසි ඉගැන්වීම පිළිබඳ පශ්චාද් උපාධි ඩිප්ලෝමා පාඨමාලාවේ අවසන් ඇගැයීමේ ක්‍රමවේදය වන (Teaching Portfolio) විෂය සකසා අදාළ මණ්ඩලයන්ගෙන් අනුමැතිය ලබා ගන්නා ලදී.

දෙවන බසක් ලෙස ඉංග්‍රීසි ඉගැන්වීම පිළිබඳ ශාස්ත්‍රපති පාඨමාලාවේ ELP2101 සහ ELP2102 සහ පර්යේෂණ පාඨමාලා දෙකට අදාළ විෂය මාලාව සහ අන්තර්ගතය සංශෝධනය කරන ලද අතර ඉගෙනුම් සම්පත් යාවත්කාලීන කිරීමත් සිදුවිය. ඒ අනුව සමකාලීන පර්යේෂණ ක්‍රියාවලීන්හි ක්‍රමවේදය පෙන්නුම් කෙරෙන පරිදි ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමත් සමාජීයවිද්‍යා හා මානව ශාස්ත්‍ර විෂය ක්ෂේත්‍රයේ පර්යේෂණ ක්‍රමවේදය නිරූපනය වන පරිදි මේවා යාවත්කාලීන වීමක් සිදුවිය.

පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ කළමනාකරණ මණ්ඩලය (Board of Management) 2005 අංක 04 දරන පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය ස්ථාපිත කිරීමේ නියමාවලිය (Ordinance) සංශෝධනය කරන ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් ඉල්ලා සිටින ලදී. 2010 වර්ෂයේ දී කළමනාකරණ මණ්ඩලය තීරණය කර තිබුණේ එම නියමාවලිය සම්බන්ධයෙන් පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය නියමාවලිය මඟින් ප්‍රතිපාදනය කොට ඇති නීතිමය රාමුව තුළ පරිපාලනමය ප්‍රශ්න බොහොමයකට මුහුණ පා ඇති හෙයින් නියමාවලිය ඉතා ඉක්මනින් සංශෝධනය කළ යුතු බවයි.

මෙම ප්‍රශ්න ආයතනයේ අධ්‍යයනමය අභිවෘද්ධිය සඳහා බලපා ඇති හෙයින් කළමනාකරණ මණ්ඩලය මඟින් පත් කරන ලද අනු කමිටුව කළමනාකරණ මණ්ඩල සාමාජික ආර්. ඒ. ඒ. රණවීර මහතා (විවෘත විශ්වවිද්‍යාලයේ පාලක සභා නියෝජිත) සහ ආචාර්ය දූෂ්යන්ති මෙන්ඩිස් මෙය (විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නම් කරන ලද සාමාජික) සහ මහාචාර්ය ආර්. රහීම් (අධ්‍යක්ෂ/පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය) යන සාමාජිකයන්ගෙන් සමන්විත වූ අතර එමඟින් නියමාවලිය සඳහා ආයතනයේ පරමාර්ථ ලඟා කරගැනීම සඳහා සහ එහි අත්‍යවශ්‍ය අඩුපාඩු සම්පූර්ණ කිරීම සඳහා ප්‍රතිපාදන සැපයෙන සංශෝධන යෝජනා කෙරිණි.

මේ හා සමගාමීව ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ නීති හා ප්‍රලේඛන අංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරි වෙතින් ලත් උපදෙස් මත සහ පාලක සභා අනුමැතිය මත යෝජිත සංශෝධනය 2011 අගෝස්තු මස දී විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත යවන ලදී. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂම විසින් දැනුම් දෙනු ලැබ ඇති පරිදි

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මඟින් මේ සම්බන්ධයෙන් කමිටුවක් පත් කොට ඇත. ඒ අනුව එමඟින් අධ්‍යයන ආයතන සහ විශ්වවිද්‍යාල කිහිපයක නියමාවලි සම්බන්ධ සංශෝධනයන් එම කමිටුව මඟින් සොයා බැලීමට නියමිතය. 2011.12.31 දින වන විටත් මේ සම්බන්ධයෙන් ඊට අමතර කිසිදු සන්නිවේදනයක් ලැබී නොතිබුණි.

පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය 2011 වර්ෂයේ දී ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය පුස්තකාලය සඳහා අනුබද්ධ සාමාජිකත්වයක් ලබා ගැනීම සඳහා ක්‍රමවේදයක් සොයා ගැනීමට අවශ්‍ය පියවර පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය මඟින් ගනිමින් තිබුණි. එම සාමාජිකත්වය 2012.01.01 දින සිට ක්‍රියාත්මකවීමට නියමිතය.

## 5. අධ්‍යක්ෂ වාර්තාව

### අධ්‍යයන ප්‍රගතිය

පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ ප්‍රථම ස්ථිර අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයා ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II ශ්‍රේණියේ තනතුරෙහි 2011 නොවැම්බර් මස දී වැඩ බාර ගත්තේය.

අධ්‍යක්ෂ තනතුර ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරි තනතුර සහ සහකාර මූල්‍යාධිකාරි තනතුර යන තනතුරු 2011 වර්ෂයේ දී අර්ධ කාලීන වැඩ බලන නිලධාරීන් මඟින් පාලනය වීම සිදුවිය.

කාර්ය මණ්ඩලයේ තත්ත්වය අඩුපාඩු සහිත වූ හෙයින් පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය පහත සඳහන් කාර්යයන් පමණක් ගත වූ වර්ෂය තුළ ඉටු කිරීමට සමත් විය.

(අ) දෙවන බසක් ලෙස ඉංග්‍රීසි ඉගැන්වීම පිළිබඳ පශ්චාද් උපාධි ඩිප්ලෝමා පාඨමාලාවට අදාළ නීති රීති සම්පාදනය සහ ඊට අදාළ අධ්‍යයන මණ්ඩල (BOS) සහ කළමනාකරණ මණ්ඩල (BOM) අනුමැතිය සහ සනාතන සභා හා පාලක සභා (විවෘත විශ්වවිද්‍යාලයේ) අනුමැතිය ලබා ගැනීම.

(ආ) දෙවන බසක් ලෙස ඉංග්‍රීසි ඉගැන්වීම පිළිබඳ පශ්චාද් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව සඳහා 2011 මැයි මස දී පුවත්පත් දැන්වීම පළ කෙරිණි. මේ සම්බන්ධයෙන් ප්‍රතිචාර යහපත් වූ අතර අයදුම්පත්‍ර 100 ක ප්‍රමාණයකින් 94 ක් අලෙවි විය.

කෙසේ වෙතත් පසුගිය වසර (2010) සමග බැලීමේ දී බඳවා ගැනීමේ විභාගයේ දී සිසුන් විසින් දක්වන ලද කුසලතා පිළිබඳව සෑහීමකට පත්විය හැකි මට්ටමක නොවීය.

ශ්‍රී ලංකාවේ ප්‍රථම උපාධිය ලැබූ අයදුම්කරුවන් බලන කල ඉංග්‍රීසි භාෂාව පිළිබඳව අඩු කුසලතාවක් පෙන්නුම් කර ඇත. මෙම විභාගයෙන් සිසුන් 42 ක් පශ්චාද් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව සඳහා ලියාපදිංචි වීමට සුදුසුකම් ලැබූ අතර එයින් 25 දෙනෙකු ලියාපදිංචිය ලැබ ඇත.

(ඇ) දෙවන බසක් ලෙස ඉංග්‍රීසි ඉගැන්වීම පිළිබඳ ශාස්ත්‍රපති පාඨමාලාවේ ඉගෙනුම් සම්පත් යාවත්කාලීන කිරීමත් සංශෝධනය කිරීමත් සිදුවිය.

(ඈ) ඉගැන්වීම, අඛණ්ඩව ඇගැයීම් පැවැත්වීම, අවසන් විභාග පැවැත්වීම (දෙවන බසක් ලෙස ඉංග්‍රීසි ඉගැන්වීම පිළිබඳ ශාස්ත්‍රපති උපාධි පාඨමාලාවේ විෂයන් නමයකට (09) අදාළ විභාගයන්) යන කටයුතු අඛණ්ඩව සිදු විය.

(ඉ) දෙවන බසක් ලෙස ඉංග්‍රීසි ඉගැන්වීම පිළිබඳ ශාස්ත්‍රපති උපාධි පාඨමාලාවේ ශිෂ්‍යයන් 06 දෙනෙකු සඳහා අදාළ උපදේශන කටයුතු, පරීක්ෂණ කටයුතු සිදුකිරීම සහ උපාධි ප්‍රදානෝත්සවය සඳහා ශිෂ්‍යයන් 06 දෙනෙකුගේ උපාධිය සම්පූර්ණ කිරීම.

(ඊ) දෙවන බසක් ලෙස ඉංග්‍රීසි ඉගැන්වීම පිළිබඳ ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව සිසුන් 16 දෙනෙකුට අදාළ පර්යේෂණ නිබන්ධ සඳහා උපදේශකත්වය සැපයීම.

(උ) දෙවන භාෂා පරිසරය තුළ ඉංග්‍රීසි සාහිත්‍යය ඉගැන්වීම පිළිබඳ යෝජිත ශාස්ත්‍රපති හා පශ්චාද් උපාධි ඩිප්ලෝමා පාඨමාලාවේ (යෝජිත) යෝජනාවලිය සංකල්පීය වශයෙන් සහ භෞතිකව පරිසමාප්තිය කරා ගෙන ඒම.

මෙම මූලික සැලසුම 2011 දෙසැම්බර් මස ආරම්භ කෙරිණි.

## 2010/2011 වර්ෂයේ ශිෂ්‍ය ක්‍රියාකාරීත්වය

සටහන - 01

**2010/2011 අවසාන ඇගැයීමේ දී ශිෂ්‍ය ක්‍රියාකාරිත්වය**

| | ELM 1301 | ELM 1201 | ELM 1202 | ELM 1203 | ELM 1101 | ELM 1102 | ELM 1104 | ELM 2101 | ELM 2102 |
|---|---|---|---|---|---|---|---|---|---|
| විභාගයට පෙනී සිටි මුළු ගණන | 13 | 12 | 13 | 09 | 09 | 07 | 17 | 06 | 07 |
| සමත්වූ ගණන | 10 | 12 | 13 | 09 | 09 | 07 | 17 | 06 | 07 |
| අසමත්වූ ප්‍රතිශතය | 03 (23%) | 0 (0%) | 0 (0%) | 0 (0%) | 0 (0%) | 0 (0%) | 0 (0%) | 0 (0%) | 0 (0%) |

**පර්යේෂණ**

2011 පෙබරවාරි මස දී පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ වාර්ෂික පර්යේෂණ සැසිය පැවැත්විණ. මෙහිදී ශිෂ්‍යයන්ගේ පර්යේෂණ පත්‍රිකා ඉදිරිපත් කිරීම ද සිදුවිය. පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ ස්ථිර කාර්ය මණ්ඩලයේ හිඟය හේතුවෙන් ආයතනික පර්යේෂණ කිසිවක් සඳහා අවතීර්ණ වීමට ඉඩක් නොලැබුණි.

ශිෂ්‍යයන් 06 දෙනෙකු ඔවුන්ගේ ශාස්ත්‍රපති උපාධියට ආදළ පර්යේෂණයන් සම්පූර්ණ කළ අතර එම පර්යේෂණයන්හි ගුණාත්මකභාවය සහ ශ්‍රී ලංකාවේ ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම් ක්ෂේත්‍රයට එයින් ලැබෙන දායකත්වය සහ ව්‍යවහාරිකවාග්විද්‍යා ක්ෂේත්‍රයේ පුළුල් පරාසය විශේෂයෙන් ශ්‍රී ලංකාවේ අනෙකුත් ජාතික විශ්වවිද්‍යාලයන්හි සේවයේ නියුතු දක්ෂ අධ්‍යයන කාර්ය මණ්ඩලය මඟින් විවේචනය භාජනය වී ඇත.

**නව වැඩ සටහන් හා පාඨමාලා**

පශ්චාද් උපාධි ඩිප්ලෝමා පාඨමාලාවේ අවසන් ඇගයීමේ විෂය වන ELP2101, ELP2102 විෂයන්ට අදාළව - Teaching Portfolio (ELP1302) විෂය ස්ථාපිත කෙරිණි. විෂය නිර්දේශය, විෂය අන්තර්ගතය සහ ඉගෙනුම් සම්පත් සංශෝධනය කිරීමත් යාවත්කාලීන කිරීමත් සිදුවිණි. ජාලගත (on-line) අධ්‍යයන පහසුව සිසුන් විසින් අවධාරණය විය. 2010 වර්ෂයේ දී විදෙස් ගත වූ එක් ශිෂ්‍යාවක් පාඨමාලාව ජාලගත පද්ධතිය මඟින් හැදෑරීම සිදුවිය.

**කාර්ය මණ්ඩලය**

2011 වර්ෂයේ දී පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ ප්‍රධාන තනතුර වන අධ්‍යක්ෂ, ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරි සහ සහකාර මූල්‍යාධිකාරි යන තනතුරු ක්‍රියාත්මක වූයේ ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ අර්ධ කාලීන වැඩ බලන අධ්‍යයන කාර්ය මණ්ඩල සහ පරිපාලන කාර්ය මණ්ඩල නිලධාරීන් මඟිනි. ඔවුන්ගේ ස්ථිර තනතුරුවලට අදාළ රාජකාරි ඉටු කරන අතරතුර ඔවුන් විසින් මෙම වැඩ බැලීමේ කටයුතු සිදු කරන ලදී.

2011 පෙබරවාරි මස 28 වෙනි දින තෙක් ඉංග්‍රීසි පිළිබඳ මහාචාර්ය ආර්. රහීම් මෙය ස්ථිර අධ්‍යක්ෂ තනතුර හෙබවූවාය. ඇගේ විශ්‍රාම යාමෙන් පසු ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ භාෂා අධ්‍යයනාංශයේ ඉංග්‍රීසි පිළිබඳ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ආචාර්ය හේමමාලා රත්වත්ත මිය විසින් 2011 මාර්තු මස 01 දින සිට අර්ධකාලීන වැඩ බලන අධ්‍යක්ෂ තනතුරෙහි වැඩ බාරගන්නා ලදී.

2011 වර්ෂය ඇතුළත දී පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ ස්ථිර අධ්‍යක්ෂ තනතුර පිරවීම සිදු නොවිණි. එසේ සිදුවූයේ තෝරා ගන්නා ලද අයදුම්කරු වැඩ බාරගැනීම සඳහා මාස කිහිපයක කාලයක් ඉල්ලා සිටීම හේතුවෙනි. 2011 ජූලි මස දී අධ්‍යක්ෂ තනතුර සඳහා නැවත අයදුම්පත් කැඳවන ලදී.

2011 දෙසැම්බර් මස 31 දින තෙක් සහකාර ලේඛකාධිකාරී ස්ථිර තනතුරෙහි සේවය කළ ජී.එස්. අමරතුංග මිය ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී තනතුරට උසස් වීමක් ලැබ ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ සේවයට එක් වූවාය. ඒ අනුව 2011 ජනවාරි මස 01 දින සිට සහකාර ලේඛකාධිකාරී තනතුර නැවත හිස් විය. ඒ අනුව ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ පරිපාලන නිලධාරීන් තිදෙනෙකු විසින් අර්ධකාලීන පදනම මත වැඩ බැලීම සිදු කරන ලදී. මීට අමතරව තවත් සහකාර ලේඛකාධිකාරීවරු දෙදෙනෙක් විවෘත විශ්වවිද්‍යාලය මඟින් අර්ධකාලීන පදනම මත පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය සඳහා අවශ්‍ය අවස්ථාවන්හි දී සේවය සැපයූහ. එම්. අයි. එච්. සුබයිර් මහතා විසින් 2011 ජනවාරි මස 18 දින සිට අප්‍රේල් මස 01 දින දක්වා සහකාර ලේඛකාධිකාරී තනතුරෙහි වැඩ බැලීම සිදු කරන ලදී. ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ සහකාර ලේඛකාධිකාරී මූලධන කටයුතු ලෙස සේවයේ නියතුව සිටි ඩී. ඩී. ජී. පී. එස් . ඩැනියෙල් මිය අර්ධකාලීන සහකාර ලේඛකාධිකාරී ලෙස 2011 අප්‍රේල් මස 01 දින සිට 2011 නොවැම්බර් 25 දක්වා සේවයේ නිරත වූවාය. ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ අධ්‍යාපන පීඨයේ සහකාර ලේඛකාධිකාරී එස්. එස්. සමරතුංග මිය අර්ධකාලීන වැඩ බැලීම පදනම මත ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී තනතුරෙහි 2011 දෙසැම්බර් මස 01 දින සිට කටයුතු කළාය. එම කාලය තුළ එක් අවස්ථාවක දී මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨයේ සහකාර ලේඛකාධිකාරී රසිකා දිසානායක මිය සහ ස්වාභාවික විද්‍යා පීඨයේ සහකාර ලේඛකාධිකාරී ප්‍රියන්තා වීරසිර මිය පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී තනතුරෙහි වැඩ බැලීම සිදු කළහ.

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ මූල්‍ය අංශයේ සේවයේ නියතු නිලධාරීහු දෙදෙනෙක් ද සමගාමීව වැඩ බලන සහකාර මූල්‍යාධිකාරී තනතුරෙහි කටයුතු කළහ. පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ ස්ථිර සහකාර මූල්‍යාධිකාරී තනතුරෙහි කටයුතු කළ කේ. කේ. චේතියමාලි මෙය 2011 පෙබරවාරි මස 28 වෙනි දින සිට ක්‍රියාත්මක වන පරිදි ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී තනතුරට උසස් වීමක් ලැබුවාය. ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය මුද්‍රණාලයේ සේවයේ නියතු සහකාර මූල්‍යාධිකාරී ඒ. ඩබ්. පී. එස්. දයානන්ද මහතා 2011 මාර්තු මස 01 වෙනි දින සිට 2011 සැප්තැම්බර් මස 16 වෙනි දින තෙක් අර්ධ කාලීන වැඩ බලන සහකාර මූල්‍යාධිකාරී ලෙස සේවය සැපයීය. 2011 සැප්තැම්බර් මස 19 වෙනි දින සිට ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී කේ. කේ. චේතියමාලි මෙය පූර්ණකාලීනව පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය වෙත මුදා හරිනු ලැබීය. ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී සහ සහකාර

මූල්‍යාධිකාරී යන පරිපාලන තනතුරු දෙක විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂම මඟින් පිරවීම සිදු නොවූ අතර විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මඟින් සියලු විශ්වවිද්‍යාලවල පුරප්පාඩු පිරවීම සඳහා සුදුස්සන් තෝරා ගැනීමට විභාග සහ සම්මුඛ පරීක්ෂණ සිදු කරමින් පැවතුණි.

2011 වර්ෂයේ අවසාන කාර්තුවේ දී පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ ප්‍රථම ස්ථිර අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයා බඳවා ගැනීමට ආයතනයට හැකි විය. ආචාර්ය එච්.එස්. රඹුක්වැල්ල මහතා ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය (II ශ්‍රේණිය) තනතුරෙහි වැඩ බාර ගැනීම 2011.11.01 දින සිදුවිය.

අනෙක් ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය තනතුර සඳහා අයදුම්පත් කැඳවන ලද්දේ 2011 වර්ෂයේ ජනවාරි මසදී ය. අනතුරුව තෝරා ගන්නා ලද අයදුම්කරු සඳහා කළමනාකරණ මණ්ඩල අනුමැතිය, සනාතන සභා අනුමැතිය හා පාලක සභා අනුමැතිය ලබා ගැනීම සිදුවිය. අයදුම්කරු තෝරා ගැනීමට ලිපි ලේඛන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා අනුමැතිය ලබා ගැනීම සඳහා පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා නියමාවලිය අනුව 2011.12.13 දින ඉදිරිපත් කෙරිණි. පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය අදාළ පත්වීම සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා අනුමැතිය අපේක්ෂාවෙන් පසුවෙයි.

## අධ්‍යයනකරුවන්හට සැපයෙන උපකාර

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ පුස්තකාලය දෙවන බසක් ලෙස ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ ශාස්ත්‍රපති උපාධිය සඳහා මාහැඟි සේවාවක් පෙර වර්ෂයන්හි දී මෙන්ම සැපයීය. එය පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ අධ්‍යයන සම්පත්වල කෝෂ්ඨාගාරය විය. ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ පුස්තකාලයාධිපතිනිය දෙවන බසක් ලෙස ඉංග්‍රීසි ඉගැන්වීමේ ශාස්ත්‍රපති උපාධි පාඨමාලාවේ අධ්‍යයන මණ්ඩල සාමජිකාවක ලෙස කටයුතු කළාය.

## අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයන්ගේ ක්‍රියාකාරකම්

**මහාචාර්ය ආර්. රහීම් මෙය, අධ්‍යක්ෂ**

දකුණු කොරියා - සියොල් නගරයේ පිහිටි විදේශීය භාෂාවක් ලෙස ඉංග්‍රීසි ඉගැන්වීම පිළිබඳ ආසියානු සංවිධානයේ විධායක කමිටුවේ සාමාජික

සභාපති, මිතුරුවැල - පිළිකා ආධාර ජාලය, කොළඹ

කොළඹ විශ්වවිද්‍යාලයේ ඉංග්‍රීසි අධ්‍යයනාංශයේ විභාග පරීක්ෂක

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ භාෂා අධ්‍යයනාංශයේ ආරාධිත දේශක සහ විභාග පරීක්ෂක

**ආචාර්ය හේමමාලා රත්වත්ත මිය, වැඩ බලන අධ්‍යක්ෂ**

ප්‍රධාන සංස්කාරක - විස්ටා (Vista) සඟරාව, මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය

සාමාජික - ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ තත්ත්ව පරීක්ෂණ කමිටුව (Quality Assurance Committee)

සභාපති - පීඨ තත්ත්ව පරීක්ෂණ සහ උපදේශන සැලසුම් කමිටුව

සාමාජික - සංස්කාරක උපදේශන මණ්ඩලය, ආසියානු TEFL සඟරාව, සියොල් කොරියාව

සංස්කාරක - ජර්නල් ඔෆ් මල්ටිලින්ගුවල් මැටර්ස්

අධ්‍යයන සංස්කාරක - ද්විභාෂක ගුරුවරුන් සඳහා ඉගෙනුම් සම්පත්, ජාතික අධ්‍යාපන ආයතනය, ශ්‍රී ලංකාව

බාහිර කථිකාචාර්ය සහ විභාග පරීක්ෂක - පේරාදෙණිය විශ්වවිද්‍යාලය (ඉංග්‍රීසි ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව)

පශ්චාද් උපාධි විභාග පරීක්ෂක - අධ්‍යාපන පීඨය/ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

සම්පත් දායක - (හිටපු සභාපති) SLELTA (ශ්‍රී ලංකා ඉංග්‍රීසි භාෂා ආචාර්යවරුන්ගේ සංගමය)

**සහයෝගය සහ සංයෝගය**

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය (Staff Development Centre) මඟින් විශ්වවිද්‍යාලයේ කාර්ය මණ්ඩලය සඳහා මෙහෙයවන ලද වැඩසටහන් සඳහා පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය අධ්‍යයන සහාය සැපයීය.

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ සහ භාෂා අධ්‍යයනාංශයේ අධ්‍යයන කාර්ය මණ්ඩලය පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ සියලු කාර්යයන් සඳහා සුපුරුදු පරිදි සිය සහාය දැක්වූහ. මෙම සහාය නොලැබෙන්නට පශ්චාද් උපාධි මට්ටමේ පර්යේෂණ කටයුතු සඳහා අවශ්‍ය උපදේශනය සහ පරීක්ෂාව මෙම ආයතනයෙන් සිදු කිරීම අසීරු කටයුත්තකි.

2010 වර්ෂය පුරාම ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ උපකුලපතිතුමා, පාලක සභා සාමාජිකයින්, නියෝජ්‍ය උපකුලපතිතුමා, ලේඛකාධිකාරී, අධ්‍යාපන, මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා, ඉංජිනේරු තාක්ෂණය, ස්වභාවික විද්‍යා යන පීඨයන්හි පීඨාධිපතිවරුන්, මූල්‍යාධිකාරී, පුස්තකාලයාධිපති, වැඩ බලන පුස්තකාලයාධිකාරි, සියලු විෂයන්හි සහකාර ලේඛකාධිකාරිවරුන් අධ්‍යාපන අංශයේ කාර්ය මණ්ඩලය, උපකුලපතිතුමාගේ කාර්යාලයේ කාර්ය මණ්ඩලය යන අයගේ නොමඳ සහය පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය වෙත ලබා දෙන ලදී.

ශාස්ත්‍රපති උපාධි පාඨමාලාවේ ස්වාධීන නිබන්ධයන් සඳහා අවශ්‍ය සහාය ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ භාෂා අධ්‍යයනාංශයේ පී. කේ. පී. අබේසූරිය මිය, ආචාර්ය රධිකා ද සිල්වා මිය, ආචාර්ය වී. වී. මැදවත්තේගෙදර මිය, ආචාර්ය දිනලි දේවේන්ද්‍ර මිය සහ ආචාර්ය හේමමාලා රත්වත්ත මිය යන අය විසින් ද ජාතික අධ්‍යාපන ආයතනයේ ඉංග්‍රීසි අධ්‍යයනාංශයේ හිටපු අධ්‍යක්ෂ එල්. කේ. කුමාරණතුංග මිය, කොළඹ විශ්වවිද්‍යාලයේ ඉංග්‍රීසි අධ්‍යයනාංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ආචාර්ය දුෂ්යන්ති මෙන්ඩිස් මිය, යාපනය විශ්වවිද්‍යාලයේ ශාස්ත්‍ර පීඨයේ ඉංග්‍රීසි භාෂා ඉගැන්වීමේ ඒකකයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය එම්. කේ. එස්. අයියර් මහතා සහ ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ සමාජීය අධ්‍යයන අධ්‍යයනාංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය එල්. ඩී. අයි. විජේතුංග මහතා, ජාතික අධ්‍යාපන ආයතනයේ හිටපු උපදේශක එන්. ඒ. එල්. වෛද්‍යසේකර මිය, දිනලි ප්‍රනාන්දු මිය, එන්. තිලකරත්න මිය යන අය ද ආරාධිත කථිකාචාර්යවරුන් ලෙස පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයට සහයෝගය සැපයීය. ජාතික අධ්‍යාපන ආයතනයේ ඉංග්‍රීසි පිළිබඳ හිටපු අධ්‍යක්ෂ විජිතා යටවත්ත මිය, කොළඹ විශ්වවිද්‍යාලයේ ඉංග්‍රීසි අධ්‍යයනාංශයේ සම්මානිත මහාචාර්ය ශිරෝමි ප්‍රනාන්දු මිය, කොළඹ විශ්වවිද්‍යාලයේ අධ්‍යාපන පීඨයේ පීඨාධිපති මහාචාර්ය මාරි පෙරේරා මිය, කැලණිය විශ්වවිද්‍යාලයේ පශ්චාද් උපධි අධ්‍යයන පීඨයේ පීඨාධිපති මහාචාර්ය මැණික් ගුණසේකර මෙය, කැලණිය විශ්වවිද්‍යාලයේ ඉංග්‍රීසි භාෂා ඉගැන්වීමේ ඒකකයේ අංශ ප්‍රධාන ආචාර්ය සී. ඩී. එස්. වැත්තැව මිය යන අය පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය වෙත බාහිර නිබන්ධ පරීක්ෂකවරයන් ලෙස සේවය සැපයීය.

**<u>සටහන</u>**

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යායේ සහ අනෙකුත් ජාතික විශ්වවිද්‍යාලයන්හි අධ්‍යයන කාර්ය මණ්ඩලය සහ අනෙකුත් කාර්ය මණ්ඩලයන්හි සාමාජික භවතුන් විසින් සපයන ලද සේවය පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය කෘතඥතා පූර්වකව සිහිපත් කර සිටියි. මෙම සහය නොලැබෙන්නට මෙම ආයතනයයේ ක්‍රියාකාරීත්වය පවත්වා ගැනීම මහත් අසීරු කර්තව්‍යයකි. මෙම සහාය මඟින් සනාථ වන්නේ පශ්චාද් උපාධි අධ්‍යයනයන්ට අදාළව ජාත්‍යන්තර ප්‍රමිතීන් පවත්වා ගෙන යනු ලබන බවයි.

## 6. සංශෝධිත මූල්‍ය ප්‍රකාශය (නව ආකෘතිය අනුව)

### (අ) පුනරාවර්තන වියදම් පිළිබඳ තොරතුරු

| විෂය | 2010 වර්ෂයේ රුපියල් | 2011 වර්ෂයේ රුපියල් |
|---|---|---|
| (අ) පුද්ගල වැටුප් හා වේතන | 2,603,399.41 | 2,070,596.24 |
| (ආ) ගමනාගමන | 35,600.00 | 41,511.00 |
| (ඇ) සැපයුම් | 160,186.37 | 369,530.57 |
| (ඈ) නඩත්තු | 67,952.00 | 116,194.40 |
| (ඉ) කොන්ත්‍රාත් සේවා | 337,752.72 | 535,419.90 |
| (ඊ) වෙනත් | 322,779.98 | 657,143.63 |
| එකතුව | 3,527,670.48 | 3,790,395.74 |

### (ආ) මූලධන වියදම් පිළිබඳ තොරතුරු

| විෂය | 2010 වර්ෂයේ රුපියල් | 2011 වර්ෂයේ රුපියල් |
|---|---|---|
| (අ) ගෘහ උපකරණ හා කාර්යාලයීය උපකරණ අත්පත් කර ගැනීම. | 30,374.40 | 140,292.60 |
| (ආ) යන්ත්‍රසූත්‍ර අත්පත් කර ගැනීම | - | - |
| (ඇ) ගොඩනැගිලි හා සැලසුම් අත්පත් කර ගැනීම | - | - |
| (ඈ) වෙනත් | 118,897.12 | 828,016.75 |
| එකතුව | 149,271.52 | 968,309.35 |

### (ඇ) මූල්‍ය ප්‍රගතිය(වියදම) පිළිබඳ තොරතුරු

| විෂය | 2011 වර්ෂයේ ප්‍රතිපාදන රු. | 2011 වර්ෂයේ වියදම රු. | ඉතිරිය/හිඟය රු. |
|---|---|---|---|
| (අ) ව්‍යාපෘති හැර පුනරාවර්තන | 6,155,000.00 | 3,790,395.74 | 2,364,604.26 |
| (ආ) ව්‍යාපෘති හැර මූලධන | 1,205,000.00 | 968,309.35 | 281,690.65 |
| (ඇ) ව්‍යාපෘති - දේශීය ප්‍රතිපාදන මත ක්‍රියාත්මක | - | - | - |
| (ඈ) ව්‍යාපෘති - විදේශීය ප්‍රතිපාදන මත ක්‍රියාත්මක | - | - | - |
| එකතුව | 7,405,000.00 | 4,758,705.09 | 2,646,294.91 |

**(ඈ) මූල්‍ය ප්‍රගතිය පිළිබඳ තොරතුරු (උපයන ලද ආදායම්)**

| **ආදායම් ප්‍රභවය** | **2011 වර්ෂයේ ප්‍රතිපාදන රු.** | **2011 වර්ෂයේ එකතුව රු.** | **අතිරික්තය/හිඟය** |
|---|---|---|---|
| (අ) ප්‍රථම උපාධි අධ්‍යයන | - | - | - |
| (ආ) පශ්චාද් උපාධි අධ්‍යයන | 1,206,000.00 | 1,452,660.00 | 246,660.00 |
| (ඇ) උපදේශක සේවා | - | - | - |
| (ඈ) වෙනත් | 150,000.00 | 363,354.01 | 213,354.01 |
| එකතුව | 1,356,000.00 | 1,816,014.01 | 460,014.01 |

**(ඉ) මූල්‍ය ක්‍රියාකාරීත්ව විශ්ලේෂණය - 2011**

| **විෂය** | **විග්‍රහය** | **ඒක ශිෂ්‍ය පිරිවැය රු.** |
|---|---|---|
| (අ) ඒක ශිෂ්‍ය පුනරාවර්තන පිරිවැය | පුනරාවර්තන වියදම්/ශිෂ්‍ය සංඛ්‍යාව | 61,135.41 |
| (ආ) ඒක ශිෂ්‍ය මූලධන පිරිවැය | මූලධන වියදම/ශිෂ්‍ය සංඛ්‍යාව | 15,617.89 |
| එකතුව | | 76,753.30 |

## පශ්චාද් උපාධි ඉංග්‍රීසි ආයතනයේ ප්‍රශ්න සොයාබැලීම සඳහා විශ්වවිද්‍යාල පාලක සභාව විසින් පත්කරන ලද අනුකමිටුවේ වාර්තාව

**<u>පසුබිම</u>** - පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය 2005 වර්ෂයේ දෙසැම්බර් මස දී ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය තුළ ස්ථාපනය කරන ලද්දේ ශ්‍රී ලංකාවේ ඉංග්‍රීසි අධ්‍යාපනයේ අභිවෘද්ධිය සඳහාය. පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ ප්‍රධාන කාර්ය භාරය වූයේ ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම පළිබඳ පශ්චාද් උපාධි සුදුසුකම් ලබාගැනීමට පහසුකම් සැපයීමයි. විශේෂයෙන්ම විශ්වවිද්‍යාල පද්ධතියේ සේවයේ නියුතු අධ්‍යයන අභිවෘද්ධිය සඳහා ඉඩප්‍රස්ථා අවම ආචාර්යවරු මෙහි දී ඉලක්ක විය. මෙවැනි පහසුකම් සැපයීමේ හදිසි අවශ්‍යතාවක් තෘතීය මට්ටමේ අධ්‍යයන කාර්ය මණ්ඩලයට පමණක් නොව ජාතික පාසල්වල ගුරු පුහුණුකරුවන්, පරිපාලන නිලධාරීන් සහ ද්විතීයික පද්ධතියේ ජ්‍යෙෂ්ඨ ඉංග්‍රීසි ආචාර්යවරුන් මෙහි දී ඉලක්ක විය. දෙවන බසක් ලෙස ඉංග්‍රීසි ඉගැන්වීම පිළිබඳ ශාස්ත්‍රපති පාඨමාලාව (TESL) 2005 ඔක්තෝබර් මස ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ දී ස්ථාපනය වූ අතර පසුව එය ඉංග්‍රීසි භාෂා පශ්චාද් උපාධි ආයතනය වෙත මාරු කෙරිණි. ඒ අනුව පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ ප්‍රථම අධ්‍යයන වගකීම මෙම වැඩසටහන විය.

පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය මගින් මෙම ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව ගතවූ වසර හයක කාලසීමාව තුළ ප්‍රබල අඩුපාඩුකම් සහිතව මෙහෙයවනු ලැබ ඇත. රෙඩින් (Reading) විශ්වවිද්‍යාලයේ ව්‍යවහාරික භාෂා අධ්‍යයන මධ්‍යස්ථානයේ විෂය ක්ෂේත්‍රයට සමගාමීව සැලසුම් කරන ලද මෙම ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව මඟින් ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම පිළිබඳ ජාත්‍යන්තර තලයේ ප්‍රමිතීන්ට අනුකූලව ශාස්ත්‍රපති උපාධි පිරිනමනු ලබයි.

මෙම උපාධි පාඨමාලාව ඉගෙනුම් ඒකක සහ පර්යේෂණ ඒකකවලින් සමන්විත සවිස්තරාත්මක අධ්‍යයනයකි. (අධ්‍යයන ඒකක හතකි (07), පර්යේෂණ ඒකක දෙකකි (02))

ආරම්භයේ සිටම මෙම පාඨමාලාවට ප්‍රධාන බාධකයක් ලෙස පැවති ප්‍රබල කරුණු අතරින් එකක් වන්නේ ශාස්ත්‍රපති උපාධි මට්ටමේ ඉගැන්වීම් කළ හැකි ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම සම්බන්ධ පාඨමාලාවන්ට අදාළව සුදුසුකම්ලත් අධ්‍යයන කාර්ය මණ්ඩලයක හිඟයයි.

අනෙක් ප්‍රශ්නය වන්නේ විවෘත විශ්වවිද්‍යාලයේ ක්‍රියාත්මක විවෘත හා දූරස්ථ අධ්‍යාපන ක්‍රමවේදය අනුව පැවැත්වෙන ශාස්ත්‍රපති උපාධි පාඨමාලාවට සුදුසු සහායක කාර්ය මණ්ඩලයක හිඟයයි.

මෙම ආයතනය ස්ථාපනය කරන ලද දින පටන් වසර පහක කාලය ඇතුළත ඉංග්‍රීසි භාෂා පශ්චාද් උපාධි ආයතනය පශ්චාද් උපාධි අධ්‍යයනයන්ට අදාළව මුහුණපාන විශේෂ ගැටලුවක් ලෙස හඳුනාගෙන තිබුණේ ඉලක්කගත පිරිසට අදාළව බලන කල අධ්‍යයන කාර්ය මණ්ඩලයේ ප්‍රමාණවත් පිරිසක් නොවීමයි. පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයෙහි ලියාපදිංචිය ලබන සියලු උපාධි අපේක්ෂකයින් ඉංග්‍රීසි භාෂාව පිළිබඳ කථිකාචාර්යවරු හෝ ඉංග්‍රීසි ගුරුවරු වුවත් ඔවුන්ගේ ක්‍රියකාරිත්වය නිරූපණය කර පෙන්වන පරිදි ඉංග්‍රීසි මාධ්‍යයෙන් කටයුතු කිරීමේ හැකියාව සහ ඉංග්‍රීසි දැනුම අපේක්ෂිත මට්ටමට උසස් තලයකට පත් වී නැත. පාඨමාලාව සම්පූර්ණ කිරීමේ ප්‍රතිශතය කෙරෙහි ද මෙම තත්ත්වය බලපා ඇති අතර ශාස්ත්‍රපති උපාධි මට්ටමේ දී පමණක් සුදුසුකම් පරීක්ෂා

කිරීම පිළිබඳව පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ නැවත අවධානය යොමු කළ යුතු ප්‍රශ්න ගණනාවක් ද මේ සමග ඉස්මතු වී ඇත. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය 2009 වසරේ දී ශාස්ත්‍රපති උපාධිය සඳහා පළමු පියවරක් ලෙස දෙවන බසක් ලෙස ඉංග්‍රීසි ඉගැන්වීමේ පශ්චාද් උපාධි ඩිප්ලෝමාව ලබාදීමට තීරණය කරන ලදී. මෙම පශ්චාද් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව අඩු ඉල්ලුමක් සහිත පාඨමාලාවක් වන අතර එය බහුතරයක් වන ශ්‍රී ලාංකික ඉංග්‍රීසි ගුරුවරුන් සඳහා වඩාත් යෝග්‍ය වන්නකි. මෙම පාඨමාලාව සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා අනුමැතිය 2010 වර්ෂයේ දී ලබා දෙන ලදී. ඒ අනුව 2011 වර්ෂයේ දී ප්‍රථම වතාවට මෙය පිරිනැමීමට ඉඩකඩ ලැබෙනු ඇත.

## පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ ප්‍රධාන ප්‍රශ්න

### 1. කාර්ය මණ්ඩලයේ හිඟය

**(අ) අධ්‍යක්ෂ තනතුර**

2011 මාර්තු මස 14 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි අධ්‍යක්ෂ තනතුර පිරවීම සඳහා තෝරා ගන්නා ලද අයදුම්කරු මෙතෙක් වැඩ බාරගෙන නැත. ඉතා ඉක්මනින් ඔහු මෙම තනතුර බාර ගන්නේ යැයි අදහස් කළ නොහැක. වැඩබලන අධ්‍යක්ෂ ලෙස කටයුතු කරන භාෂා අධ්‍යයන අධ්‍යයනාංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරිය අධ්‍යයනාංශ මට්ටමින් වගකීම් දරන ආචාර්යවරියක් වන අතර ඇය පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ වැඩ ආවරණය කරයි. දීර්ඝකාලීනව බලන කල මෙම ක්‍රමවේදය සතුටට පත්විය හැක්කක් නොවේ.

**(ආ) සහකාර ලේඛකාධිකාරී සහ සහකාර මූල්‍යාධිකාරී තනතුරු**

මෙම ආයතනයේ සහකාර ලේඛකාධිකාරී සහ සහකාර මූල්‍යාධිකාරී තනතුරු පුරප්පාඩුව පවතී. නුදුරු අනාගතයේ දී මෙම තනතුරු පුරවනු ඇතැයි සහතික විය නොහැක. මේ පිළිබඳව දැඩි අවධානය ලක්විය යුතු වන්නේ මෙහි ඇති වැඩ කොටස සඳහා පූර්ණකාලීන පරිපාලන නිලධාරීන්ගේ සේවය අවශ්‍ය වන බැවිනි. මේ වන විට දෛනික කටයුතු ඉටු කරනු ලබන්නේ ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ මුද්‍රණාලයේ සහකාර මූල්‍යාධිකාරී තනතුර දරන සහාකාර මූල්‍යාධිකාරීවරයෙකු සහ ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ රාජකාරි කටයුතු බහුල මූලධන අංශයේ ස්ථිර සහකාර ලේඛකාධිකාරීවරිය විසිනි.

(ඇ) මෙම ආයතනයේ අධ්‍යයන කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු දෙකක් පවතී. එයින් එක් පුරප්පාඩුවක් 2011 වර්ෂයේ සැප්තැම්බර් මස දී පිරවීමට නියමිතය. අනෙක් තනතුර සඳහා අයදුම්පත් කැඳවා ඇති අතර සම්මුඛ පරීක්ෂණ 2011 මැයි අවසානයේ පැවැත්වීමට සැලසුම් කර තිබුණි. ඒ අනුව නව අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයා නව පද්චාද් උපාධි ඩිප්ලෝමා සහ ශාස්ත්‍රපති උපාධි පාඨමාලාවේ දේශන ආරම්භයත් සමඟ ස්ථානගත වනු ඇත. කෙසේ වෙතත් විශ්වවිද්‍යාලයේ පවත්නා වත්මන් තත්ත්වය අනුව සම්මුඛ පරීක්ෂණ පැවැත්වීම සඳහා කල් ගත වනු ඇත.

(ඇ) පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය සඳහා පරිගණක යෙදවුම් සහකාරවරයෙකු සහ පොත් තබන්නෙකු අවශ්‍ය වී ඇත. මේ සම්බන්ධයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත ඉල්ලීමක් කර ඇත. නමුත් මෙතෙක් කිසිදු ප්‍රතිචාරයක් ලැබී නැත.

(ඉ) කෙටියෙන් සඳහන් කරන්නේ නම් පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය ඉතා තදබල කාර්ය මණ්ඩල හිඟයකට මුහුණපා ඇත. ඒ අනුව අනුමත කාර්ය මණ්ඩල තනතුරු හඳුනාගෙන දීර්ඝ කාලීනව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත අදාළ ඉල්ලීම් කළ යුතුය.

**2. ප්‍රමාණවත් නොවන ඉඩකඩ පහසුකම්**

(අ) මේ වන විට පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ ගොඩනැගිල්ලක කුඩා කොටසක (කාමර තුනක) ස්ථාපිතව ඇති අතර මෙම කොටස දෛනික කාර්යයන් ඉටුකිරීම සඳහා ද ප්‍රමාණවත් නොවන්නකි. පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය අනාගතයේ දී පාඨමාලා සහ බඳවා ගනු ලබන ශිෂ්‍ය සංඛ්‍යාව ඉහළ දැමීමට සැලසුම් කර ඇති හෙයින් තවත් ඉඩකඩ අවශ්‍ය කෙරේ.

**3. පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ නියමාවලිය (Ordinance) සඳහා සංශෝධන ඉදිරිපත් කිරීම.**

පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ දියුණුවට බාධා ඇති කෙරෙන නීතිමය ගැටලු කිහිපයකි. අංක VV/362/11 දරන 2011 මැයි මස 27 දින පැවති පාලක සභා පත්‍රිකාව මඟින් 362 වෙනි පාලක සභා රැස්වීම සඳහා මෙම බාධාවන් ඉදිරිපත් කරනු ලැබ ඇත. (පිටුව 28-30)

මේ අතරින් ප්‍රමුඛව හඳුනාගත හැකි ගැටලුව වන්නේ අනෙකුත් පශ්චාද් උපාධි ආයතනවල කළමනාකරණ මණ්ඩලයේ සභාපතිත්වය දරණ ආයතන අධ්‍යක්ෂ මෙහි සභාපතිත්වය දැරීමට පත් නොකොට ඒ සඳහා ඉංග්‍රීසි පිළිබඳ ස්ථාවර කොමිසමේ (Standing Committee on English) සභාපති මේ සඳහා නම් කොට තිබීමයි.

මහාචාර්ය එච්.පී.එම්. ගුණසේන                    මහාචාර්ය ඩබ්.අයි. සිරිවීර

පාලක සභා සමාජිකයින්

## 7. විගණන කමිටුවේ වාර්තාව

### අභ්‍යන්තර විගණන වාර්තාව

විශ්වවිද්‍යාලයීය අභ්‍යන්තර විගණන ඒකකය විසින් ස්වකීය විගණන කටයුතු ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ සහ පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ඒකකයට අදාළව විධිමත් පරිදි ගත වූ වර්ෂයට අදාළව සිදු කරන ලදී. ඒ අනුව පහත සඳහන් ක්ෂේත්‍රයන්හි අභ්‍යන්තර විගණන අංශයේ අධීක්ෂණයට හසු වී ඇත.

1. **පූර්ව විගණනය**

- විශ්වවිද්‍යාලයීය අර්ථසාධක අරමුදලේ මුදල් නිදහස් කිරීම. } ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
- ග්‍රැටිවිටි (Gratuity) ගෙවීම.
- කොන්ත්‍රාත් සඳහා අවසන් ගෙවීම් සහ රැඳවුම් නිදහස් කිරීම.

2. **සමීක්ෂණ**

- වාර්ෂික තොග සමීක්ෂණය (ප්‍රධාන ගබඩාවේ) 2011.12.31 දිනට සිදු කෙරිණි.

3. **සොයා ගන්නා ලද තත්වයන්ට අදාළ විගණන විමසුම්**

- 2010 අධ්‍යයන ක්‍රියාකාරීත්වය
- ස්ථාවර වත්කම් ලේඛනය
- වාර්ෂික  ස්ථාවර වත්කම් සමීක්ෂණය

4. **විගණන කමිටුව**

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය විගණන කමිටුව ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ සහ පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ කාර්යයන් විමසා බැලීම සඳහා නිරන්තරයෙන් අදාළ රැස්වීම් පවත්වනු ලබයි. මෙම කමිටුව මඟින් විගණකාධිපති සහ අභ්‍යන්තර විගණන අංශය මඟින් ඉදිරිපත් කරන ලද විගණන විමසුම් හා වාර්තා සහ ඒ සඳහා ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයත් පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයත් විසින් සපයනු ලැබ ඇති පිළිතුරු සලකා බලයි. මෙම කමිටුව මඟින් නිවැරදි ක්‍රියාමාර්ගයන් සඳහා මඟ පෙන්වීම සහ උපදෙස්දීම සිදු කරයි. පසුව සිදුවන නිවැරදි ක්‍රියාමාර්ගයන් පිළිබඳව ද අධීක්ෂණය කෙරේ. සලකා බලන වර්ෂයේ දී විගණන කමිටුව සත් වරක් රැස් වී ඇත.

5. **කාර්ය මණ්ඩලය**

අභ්‍යන්තර විගණන අංශය පහත සඳහන් කාර්ය මණ්ඩලයෙන් සමන්විතයි.

- සහකාර අභ්‍යන්තර විගණක (තනතුර පුරප්පාඩුව තිබුණි.)
- විගණන සහකාරවරයෙක්
- ලිපිකරුවෙක්
- පරිගණක යෙදවුම් සහකාරවරයෙක්
- තාවකාලික කම්කරුවෙක්

**සටහන: නැවත විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශනය**

2011 ජුනි 10 වෙනි දින නිකුත් කරන ලද අංක HE/PL/140 දරන උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලිපියට අනුව විමසා තිබුණේ ගිණුම් වාර්ෂික වාර්තාවේ සඳහන් ආකෘතියට අනුව ඉදිරිපත් කළ යුතු බවයි. ඒ අනුව මෙහි පිටු අංක 24, 25 (මෙම වාර්තාවේ අංක 06 කොටස) දරන ගිණුම් ඉහත උපදෙස් අනුව සකස් කොට ඇත.

කෙසේ වෙතත්, ඉදිරිපත් කරන ලද ගිණුම් පිළිබඳ විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතයන්ට අනුව කලින් භාවිත වූ ආකෘතියට අනුව ලබා දී ඇත. විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කරන ලද ගිණුම් විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතයන්ට අනුව කලින් භාවිත වූ ආකෘතියට අනුව ලබා දී ඇත. විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කරන ලද ගිණුම් විගණකාධිපතිවරයාගේ වාර්තාවේ 8 වෙනි කොටස ලෙස සම්බන්ධ කොට ඇත.

## 8. විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන

PGIE
POST GRADUATE
INSTITUTE OF
ENGLISH

# පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය

## ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

## මූල්‍ය වාර්තාව

## 2011

## පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය
### 2011.12.31 දිනට ශේෂ පත්‍රය

| 31.12.2010 රු. | | සටහන් අංකය | | 31.12.2011 රු. |
|---|---|---|---|---|
| | වත්කම් | | | |
| | ජංගම නොවන වත්කම් | | | |
| 2,073,892.71 | දේපල පිරියත හා උපකරණ | 14 | | 2,526,860.26 |
| | ජංගම වත්කම් | | | |
| 4,496,832.82 | කෙටි කාලීන ආයෝජන | 15 | 5,826,360.32 | |
| 140,634.42 | තොග | | 94,960.23 | |
| 232,084.00 | සේවක ණය හා අත්තිකාරම් | 16 | 173,915.00 | |
| 118,897.12 | සැපයුම් සහ සේවා සඳහා අත්තිකාරම් | | - | |
| - | විවිධ අත්තිකාරම් | | - | |
| 37,842.81 | විවිධ ණයගැතියෝ | | 71,276.40 | |
| 1,162,556.78 | බැංකුවේ ඇති මුදල් | 17 | 1,179,231.60 | |
| | | | | 7,345,743.55 |
| **8,262,740.66** | | | | **9,872,603.81** |
| | ස්කන්ධය හා වගකීම් | | | |
| | ප්‍රාග්ධනය හා සංචිත | | | |
| | ප්‍රාග්ධනය | | | |
| 2,192,789.83 | වැය කළ මූලධන ප්‍රතිපාදන | | 2,526,860.26 | |
| 100,707.90 | වැය නොකළ මූලධන ප්‍රතිපාදන | 18 | 321,742.02 | |
| - | තොරතුරු තාක්‍ෂණ ප්‍රතිපාදන | | | |
| | සංචිත | | | |
| 571,142.00 | පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා අරමුදල | | 2,281,162.77 | |
| 2,864,639.73 | | | | 5,129,765.05 |
| | ජංගම නොවන වගකීම් | | | |
| | විශේෂිත අරමුදල් | | | |
| 4,007,085.60 | ප.උ.ඉ.භා. ආයතන සංවර්ධන අරමුදල | | 3,959,285.43 | |
| 754,003.00 | පාරිතෝෂික සඳහා වෙන්කිරීම් | | 256,600.50 | |
| | | | | 4,215,885.93 |
| | ජංගම වගකීම් | | | |
| 375,202.66 | උපචිත වියදම් | 19 | 477,059.04 | |
| 261,809.67 | විවෘත විශ්වවිද්‍යාලයට ගෙවිය යුතු ශේෂය | | 33,117.14 | |
| - | විවිධ ණයහිමියෝ | | 16,776.65 | |
| | | | | 526,952.83 |
| **8,262,740.66** | | | | **9,872,603.81** |
| - | පිලියෙල කළේ වැ.බ.සහකාර මූල්‍යාධිකාරී | | | - |

කළමනාකරණ මණ්ඩලය වෙනුවෙන්

අධ්‍යක්‍ෂ                                                    ජ්‍යෙ. සහකාර ලේඛකාධිකාරී

## පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය

### 2011.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

### ආදායම් වියදම් ගිණුම

| 2010 (රු) | | සටහන් අංකය | | 2011 (රු) |
|---|---|---|---|---|
| | **ආදායම** | | | |
| 2,748,000.00 | රජයේ ආධාර - පුනරාවර්තන වියදම් සඳහා ප්‍රතිපාදන | | | 3,187,000.00 |
| 6,638.00 | රජයේ ආධාර - පුනරුත්තාපන පුනරාවර්තන | | | 60,656.53 |
| - | පුනරුත්තාපන වියදම් සඳහා දායක මුදල | | | 47,800.17 |
| 40,100.00 | ශිෂ්‍ය ලියාපදිංචි ගාස්තු | | | 35,810.00 |
| 963,980.00 | අධ්‍යයන ගාස්තු | | | 1,043,440.00 |
| 73,500.00 | විභාග ගාස්තු | | | 81,000.00 |
| 304,705.50 | පොලී ආදායම් | | | 319,294.01 |
| 93,000.00 | අයදුම්පත් විකුණුම් ආදායම් | | | 97,000.00 |
| 3,050.00 | විවිධ ලැබීම් | | | 44,060.00 |
| 15,420.00 | පරිපූරක ගාස්තු | | | 12,540.00 |
| 163,470.00 | නිබන්ධන ගාස්තු | | | 182,870.00 |
| 512,304.36 | ප්‍රාග්ධන ප්‍රතිපාදන ක්‍රමක්ෂය | | | 634,238.92 |
| **4,924,167.86** | මුළු ආදායම | | | **5,745,709.63** |
| | **වියදම්** | | | |
| 3,527,670.48 | සාමාන්‍ය පරිපාලන හා අධ්‍යයන සේවා වියදම් | 20 | 3,790,395.74 | |
| 6,638.00 | වියදම් - පුනරුත්තාපන පුනරාවර්ථන | | 108,456.70 | |
| 512,304.36 | ක්ෂය සඳහා වෙන් කිරීම් | | 634,238.92 | |
| 51,100.00 | පාරිතෝෂික සඳහා වෙන් කිරීම් | | (497,402.50) | |
| **4,097,712.84** | මුළු වියදම | | | **4,035,688.86** |
| **826,455.02** | අතිරික්තය/ඌනතාව | | | **1,710,020.77** |
| **(447,689.23)** | ඉ/ගෙ ශේෂය | | | **571,142.00** |
| 192,376.21 | **පූර්ව වර්ෂ ගැලපීම්** | | | - |
| **571,142.00** | ප/ගෙ ශේෂය | | | **2,281,162.77** |

## මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

1 **වාර්තා කිරීමේ අස්ථිත්වය**

2005 අංක 04 දරන පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතන නියමාවලිය යටතේ පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය පිහිටුවා ඇත. 2006 ඔක්තෝම්බර් 01 දින සිට එහි මෙහෙයුම් ක්‍රියාකාරකම් ආරම්භ කරන ලදී.

2. **අනුකූලතා ප්‍රකාශනය.**

පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගණකාධිකරණ මූලධර්මයන්ට ද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට ද , 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ අවශ්‍යතාවන් හා 2002 වර්ෂයේ රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක PF/PE 21ට අනුකූලව පිළියෙල කර ඇත.

3. **ඇගයීමේ පදනම**

ඓතිහාසික පිරිවැය පදනම යටතේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇත.

4. **රජයේ ප්‍රතිපාදන**

ගිණුම් වර්ෂය තුළ රජයෙන් ලැබුණු මුළු ප්‍රතිපාදන ප්‍රමාණය රු. 4,437,000.00 වේ. මෙයින් රු. 3,187,000.00 ක් පුනරාවර්තන වියදම් ලෙස හඳුනාගෙන ඇති අතර එය ආදායම් ප්‍රකාශනයේ ආදායමක් ලෙස දක්වා ඇත. මූලධන වියදම් සඳහා ලද රජයේ ආධාර මුදල වැය නොවූ මූලධන ආධාර යටතේ ගිණුම් ගත කර ඇති අතර වැය කළ මුදල ප්‍රාග්ධන ගිණුමට මාරු කර ඇත. අදාළ තොරතුරු පහත පරිදි වේ.

| | 2011 වර්ෂයේ දී ලැබුණු මුදල (රු.) | වැය නොකළ මුදල (රු.) |
|---|---|---|
| පුනරාවර්තන ආධාර | 3,187,000.00 | - |
| ප්‍රාග්ධන ආධාර | | |
| පුනරුත්තාපන - ගොඩනැගිලි හා සවිකිරීම් | - | - |
| ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ | 400,000.00 | 263,164.67 |
| පුස්තකාල පොත් හා වාර සඟරා | 850,000.00 | 23,577.35 |
| එකතුව | 4,437,000.00 | 286,742.02 |

5. **මූලධන වියදම් ප්‍රතිපාදන ක්‍රමක්ෂය**

මූලධන වියදම් සඳහා ලද ප්‍රතිපාදන ප්‍රාග්ධනීතකර අදාළ වත්කම්හි ප්‍රයෝජනවත් ජීවිත කාලය තුළ ක්‍රමක්ෂය කෙරේ. මිලදීගත් වර්ෂයේ දී ක්‍රමක්ෂය නොකිරීම හා ඉවත්කරන වර්ෂයේ දී සම්පූර්ණ වර්ෂය සඳහා ක්‍රමක්ෂය කිරීම ආයතනයේ ක්‍රමක්ෂය කිරීමේ ප්‍රතිපත්තිය වේ.

6. **ආදායම හඳුනා ගැනීම**

රජයෙන් ලැබුණු ප්‍රදානයන් සහ වි.වි.ප්‍ර.කො. සභාවෙන් ලැබුණු ප්‍රදානයන් ඒවා ලැබුණු පදනම මත ගිණුම්ගත කර ඇති අතර පාඨමාලා ගාස්තුව හා අනෙකුත් ආදායම් ලද අවස්ථාවේ දී ආදායමක් ලෙස හඳුනාගෙන ඇත.

7. **වියදම් හඳුනා ගැනීම**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නිකුත් කර ඇති වියදම් ශීර්ෂයන්ට අනුකූලව වියදම් වර්ගීකරණය හා විශ්ලේෂණය සිදුකර ඇත.

8. **බදු කරණය**

දේශීය ආදායම් පනතේ විධානයන්ට අනුව පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයට ලැබෙන ලාභාංශ හා පොලී ආදායම් හැර අනෙකුත් ආදායම්, ආදායම් බද්දෙන් නිදහස් කර ඇත.

9. **සේවකයන් සඳහා විශ්‍රාම ප්‍රතිලාභ**

වර්ෂ 01 ක අඛණ්ඩ සේවාකාලයක් සහිත කාර්ය මණ්ඩල සාමාජිකයන් වෙනුවෙන් විශ්‍රාම පාරිතෝශික සඳහා වෙන් කිරීම් කර ඇත. නමුත් විශ්වවිද්‍යාල පද්ධතිය තුල වර්ෂ 05 ක අඛණ්ඩ සේවාකාලයක් සහිත කාර්ය මණ්ඩල සාමාජිකයන් හට පමනක් විශ්‍රාම ගැනීමේ දී විශ්‍රාම පාරිතෝශිකය ලැබීමට හිමිකම් ඇත්තේය.

10. **වගකීම්**

මූල්‍ය ප්‍රකාශ පිළියෙල කරන අවස්තාවේ දී හඳුනාගත් සියලු වගකීම් ගිණුම් ගත කර ඇත.

11. පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ පවතින සීමිත ඉඩ පහසුකම් හේතුවෙන් වර්ෂය තුළ මිලදීගත් පොත් පත් හා වාර සඟරා විවෘත විශ්වවිද්‍යාලයේ ප්‍රධාන පුස්තකාලය වෙත පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ ශිෂ්‍යයන්ගේ පරිහරණය සඳහා බාරදී ඇත.

12. විවෘත විශ්වවිද්‍යාලයේ පුස්තකාලය විසින් පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතන සඳහා වෙන්කර ඇති කොටසේ පාවිච්චි සඳහා පරිගණක යන්ත්‍ර 03 ක් හා UPS යන්ත්‍ර 03 ක් බාරදී ඇත.

13. **මුදල් ප්‍රවාහ ප්‍රකාශය**

වක්‍ර ක්‍රමය අනුව මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිලියෙල කර ඇත.

14. **දේපල පිරියත හා උපකරණ**

(අ) 05.10.1995 දින දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍ර ලේඛ අංක 649 අනුව දේපල පිරියත හා කාර්යාල උපකරණ ක්ෂය කර ඇත. වත්කම මිලදීගත් වර්ෂයේ ක්ෂය නොකරන අතර වත්කම් ඉවත්කරන වර්ෂයේ මුළු වර්ෂයටම ක්ෂය ගණනය කිරීම ආයතනයේ ක්ෂය ප්‍රතිපත්තිය වේ.

(ආ) පිළිගත් වාර්ෂික ක්ෂය ප්‍රතිපාදන ප්‍රතිශතයන් පහත පරිදි වේ.

| | |
|---|---|
| ❖ ගෘහභාණ්ඩ හා සවිකිරීම් | 10% |
| ❖ කාර්යාල උපකරණ | 20% |
| ❖ පරිගණක හා උපාංග | 20% |
| ❖ පුස්තකාල පොත් | 20% |

(ඇ) ස්ථාවර වත්කම් සමුච්චිත ක්ෂය අඩුකළ පසු වටිනාකමට දක්වා ඇත.

(ඉ) ස්ථාවර වත්කම්වල අපේක්ෂිත ඵලදායී ජීවිත කාලය මත සරල මාර්ග ක්‍රමය අනුව ක්ෂය ගනනය කර ඇත.

(ඊ) ජංගම නොවන වත්කම් පිළිබඳ තොරතුරු

| පිරිවැය | ගෘහභාණ්ඩ හා සවිකිරීම් | කාර්යාල උපකරණ | පුස්තකාල පොත් හා වාර සඟරා | පරිගණක හා උපාංග | එකතුව |
|---|---|---|---|---|---|
| 01/01/2011 දිනට ශේෂය | 478,258.01 | 1,144,657.00 | 479,508.78 | 1,093,627.72 | 3,196,051.51 |
| එකතුකළා: වර්ෂය තුළ මිලට ගැනීම් | 41,592.60 | 39,000.00 | 946,913.87 | 59,700.00 | 1,087,206.47 |
| 31/12/2011 දිනට ශේෂය | 519,850.61 | 1,183,657.00 | 1,426,422.65 | 1,153,327.72 | 4,283,257.98 |
| ක්ෂය | | | | | |
| 01/01/2011 දිනට ශේෂය | 74,637.20 | 323,911.80 | 422,968.72 | 300,641.08 | 1,122,158.80 |
| එකතුකළා: වර්ෂය සඳහා ක්ෂය | 47,825.80 | 228,931.40 | 138,756.18 | 218,725.54 | 634,238.92 |
| 31/12/2011 දිනට ශේෂය | 122,463.00 | 552,843.20 | 561,724.90 | 519,366.62 | 1,756,397.72 |
| 01/01/2011 දිනට ශුද්ධ වටිනාකම | 403,620.41 | 820,745.20 | 56,540.06 | 792,986.64 | 2,073,892.71 |
| 31/12/2011 දිනට ශුද්ධ වටිනාකම | 397,387.61 | 630,813.80 | 864,697.75 | 633,961.10 | 2,526,860.26 |

(උ) සමුච්චිත ක්ෂය ප්‍රතිපාදනය හා ප්‍රාග්ධන දීමනා ක්‍රමක්ෂය ප්‍රමාණයන් සමාන වන බැවින් පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා අරමුදලේ (පොදු සංචිතය) විශ්ලේෂණය අවශ්‍ය නොවේ. (විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ 05/10/95 දිනැති චක්‍රලේඛ අංක 649 බලන්න)

## 15. කෙටිකාලීන ආයෝජන

කෙටිකාලීන මුදල් අතිරික්තයන් මහජන බැංකුවේ "කෙටිකාලීන ස්ථාවර තැන්පතු" මත ආයෝජනය කර ඇත. උපචිත පොලිය ද සහිතව ආයෝජනයන්හි ඉදිරියට ගෙනයන ශේෂය ගණනය කරඇත.

| ගිණුම් අංකය | 01/01/2011 දිනට වටිනාකම | නව ආයෝජන | 2011 වර්ෂය සඳහා උපචිත පොලිය | 31/12/2011 දිනට ශේෂය |
|---|---|---|---|---|
| 174-60-01-00005984-5 | 657,591.73 | | 40,352.16 | 657,591.73 |
| 174-60-01-00007239-4 | 330,621.18 | | 19,373.96 | 349,995.14 |
| 174-60-01-00007243-8 | 1,108,034.27 | | 67,992.91 | 1,176,027.18 |
| 174-60-01-00007242-9 | 1,108,034.27 | | 67,992.91 | 1,176,027.18 |
| 174-60-01-00007506-0 | 215,425.23 | | 13,219.26 | 228,644.49 |
| 174-60-01-00007507-9 | 538,563.07 | | 33,048.15 | 571,611.22 |
| 174-60-01-00007505-1 | 538,563.07 | | 33,048.15 | 571,611.22 |
| 174-60-01-00009637-8 | | 300,000.00 | 4,500.00 | 304,500.00 |
| 174-60-01-00010042-5 | | 250,000.00 | | 250,000.00 |
| 174-60-01-00010043-4 | | 250,000.00 | | 250,000.00 |
| 174-60-01-00010044-3 | | 250,000.00 | | 250,000.00 |
| එකතුව | | | | 5,826,360.32 |

## 16. සේවකයන් සඳහා ණය හා අත්තිකාරම්

| | | |
|---|---|---|
| සේවක ණය | | 3,060.00 |
| එම්.එච්.පී .එච්. ජයවර්ධන මහතා | 3,060.00 | |
| ආපදා ණය | | 163,505.00 |
| එම්.එච්.පී .එච්. ජයවර්ධන මහතා | 163,505.00 | |
| වාහන ණය | | 5,100.00 |
| එම්.එච්.පී .එච්. ජයවර්ධන මහතා | 5,100.00 | |
| විශේෂ අත්තිකාරම් | | 250.00 |
| එම්.එච්.පී .එච්. ජයවර්ධන මහතා | 250.00 | |
| උත්සව අත්තිකාරම් | | 2.000.00 |
| පී.එස්. අමරතුංග මහත්මිය | 1.000.00 | |
| එම්.එච්.පී .එච්. ජයවර්ධන මහතා | 1.000.00 | |
| | | 173,915.00 |

## 17. බැංකුවේ ඇති මුදල්

| | |
|---|---|
| මහජන බැංකුව ජංගම ගිණුම් අංක 174100156838310 | 286,500.14 |
| මහජන බැංකුව ජංගම ගිණුම් අංක 174100246838310 | 323,451.19 |
| මහජන බැංකුව ජංගම ගිණුම් අංක 174100336838310 | 569,280.27 |
| | 1,179,231.60 |

## 18. වැය නොවූ මූලධන ආධාර

| | |
|---|---|
| පුනරුත්තාපන - ගොඩනැගිලි හා සවිකිරීම් | - |
| පුනරුත්තාපන - යන්ත්‍රසූත්‍ර හා උපකරණ | 35.000.00 |
| ගෘහභාණ්ඩ හා කාර්යාල උපකරණ | 263,164.67 |
| පුස්තකාල පොත් හා වාර සඟරා | 23,577.35 |
| එකතුව | 321,742.02 |

## 19. උපචිත වියදම්

| | |
|---|---|
| විගණන ගාස්තු 2009 (15% VAT ඇතුළුව) | 131.040.00 |
| විගණන ගාස්තු 2010 (15% VAT ඇතුළුව) | 144.144.00 |
| විගණන ගාස්තු 2011 (15% VAT ඇතුළුව) | 158.558.40 |
| ඇතුලත්වීමේ විභාග සඳහා විභාග ගාස්තු - 2010 | 7,100.00 |
| දුරකථන වියදම් | 4,457.62 |
| ඇතුලත්වීමේ විභාග සඳහා විභාග ගාස්තු - 2011 | 8,300.00 |
| අතිකාල වියදම් | 3,271.52 |
| වැඩ බැලීම සඳහා ගෙවීම් | 20,187.50 |
| මුළු එකතුව | 477,059.04 |

## 20. පුනරාවර්තන වියදම්

| | | | |
|---|---|---|---|
| **පුද්ගල පඩිනඩි** | | | 2,070,596.24 |
| **පුද්ගල පඩිනඩි - අධ්‍යයන** | | | 572,150.40 |
| **වැටුප් හා වේතන - අධ්‍යයන** | | 327,667.26 | |
| වැටුප් හා වේතන | 197,510.00 | | |
| විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල | 29,004.38 | | |
| විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප් අරමුදල | 6,960.00 | | |
| සේවක භාරකාර අරමුදල 3% | 7,192.88 | | |
| බාහිර කථිකාචාර්ය ගෙවීම් | 87,000.00 | | |
| **වෙනත් දීමනා - අධ්‍යයන** | | 244,483.14 | |
| අධ්‍යයන දීමනා | 86,382.63 | | |
| පර්යේෂණ දීමනා | 18,825.00 | | |
| ජීවන වියදම් දීමනා | 22,200.00 | | |
| විශේෂ දීමනා | 9,875.50 | | |
| වැඩ බැලීමේ ගෙවීම් | 107,200.01 | | |
| **පුද්ගල පඩිනඩි - අනධ්‍යයන** | | | 1,498,445.84 |
| **වැටුප් හා වේතන - අනධ්‍යයන** | | 1,127,046.38 | |
| වැටුප් හා වේතන | 847,200.32 | | |
| විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල | 106,138.36 | | |
| විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප් අරමුදල | 44,634.19 | | |
| සේවක භාරකාර අරමුදල | 30,154.50 | | |
| වැඩ බැලීමේ ගෙවීම් | 98,919.01 | | |
| **වෙනත් දීමනා - අනධ්‍යයන** | | 301,532.08 | |
| භාෂා දීමනාව | 7,326.29 | | |
| ජීවන වියදම් දීමනා | 251,859.68 | | |
| විශේෂ දීමනා | 42,346.11 | | |
| **අතිකාල සහ නිවාඩු දින ගෙවීම්** | | 69,867.38 | |
| අතිකාල දීමනා | 69,867.38 | | |
| **පුනරාවර්තන වියදම් - පුද්ගල පඩිනඩි වලට අමතර** | | | **1,719,799.50** |
| **ගමන් වියදම්** | | | **41,511.00** |
| ගමන් වියදම් - දේශීය | | 41,511.00 | |
| **සැපයුම්** | | | **369,530.57** |
| ලිපිද්‍රව්‍ය හා කාර්යාල අවශ්‍යතා | | 345,385.45 | |
| වෙනත් | | 24,145.12 | |
| නිල ඇඳුම් | 3,752.89 | | |
| අනෙකුත් සැපයුම් | 20,392.23 | | |
| **නඩත්තු වියදම්** | | 116,194.40 | |
| නඩත්තු - යන්ත්‍රසූත්‍ර හා උපකරණ | 116,194.40 | | |

| | | | |
|---|---|---|---|
| **සේවා** | | | 535,419.90 |
| තැපැල් හා සන්නිවේදන වියදම් | | 107,012.86 | |
| දුරකතන වියදම් | 55,869.86 | | |
| තැපැල් වියදම් | 51,143.00 | | |
| වෙනත් | | 428,407.04 | |
| මුද්‍රණ හා ප්‍රචාරණ වියදම් | 248,407.04 | | |
| විදුලි වියදම් | 152,943.60 | | |
| කුලී වියදම් | 27,056.40 | | |
| | | | |
| **වෙනත් පුනරාවර්තන වියදම්** | | | **657,143.63** |
| දුම්රිය වාර ප්‍රවේශ පත්‍ර ගාස්තු | 4,500.00 | | |
| සංග්‍රහ වියදම් | 61,663.00 | | |
| බැංකු ගාස්තු | 8,088.92 | | |
| වැඩමුළු සහ සම්මන්ත්‍රණ | 14,237.00 | | |
| විශේෂ සේවා - කළමණාකරන කමිටු | 247.400.00 | | |
| විභාග ගාස්තු | 79,890.00 | | |
| විශේෂ සේවා - වෘත්තීය හා අනෙකුත් ගෙවීම් | 166,354.63 | | |
| අනෙකුත් පුනරාවර්තන වියදම් | 75,010.08 | | |
| **මුළු වියදම** | | | 3,790,395.74 |

## පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය
2011.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| 2010 (Rs.) | | 2011 (Rs.) |
|---|---|---|
| | **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් උත්පාදනය මුදල් ප්‍රවාහයන්** | |
| 826,455.02 | සාමාන්‍ය ක්‍රියාකාරකම්වලින් ලද අතිරික්තය/(ඌනතාව) | 1,710,020.77 |
| | **මුදල් නොවන ප්‍රවාහයන්** | |
| 512,304.36 | ස්ථාවර වත්කම් ක්ෂය | 634,238.92 |
| 51,100.00 | පාරිතෝෂික | (497,402.50) |
| 192,376.21 | පූර්ව වර්ෂ ගැලපීම් | - |
| 512,304.36 | ප්‍රාග්ධන ප්‍රතිපාදන ක්‍රමක්ෂය | 634,238.92 |
| **1,069,931.23** | **කාරක ප්‍රාග්ධනයේ වෙනස්වීමට පෙර මෙහෙයුම් ලාභය** | **1,212,618.27** |
| | **කාරක ප්‍රාග්ධනයේ වෙනස්වීම** | |
| (140,634.42) | තොගයේ අඩුවීම/(වැඩිවීම) | 45,674.19 |
| (351,073.66) | වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු දෑ අඩුවීම/(වැඩිවීම) | 143,632.53 |
| 152,208.81 | උපචිත වියදම් වැඩිවීම/(අඩුවීම) | (110,059.50) |
| **730,431.96** | මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය | **1,291,865.49** |
| | **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ලද මුදල් ප්‍රවාහයන්** | |
| (30,374.40) | දේපල පිරියත හා උපකරණ මිළදී ගැනීම | (1,087,206.47) |
| (668,375.00) | විශේෂිත කාර්යන් සඳහා අරමුදල් හා ලැබීම් | (47,800.17) |
| - | පරිත්‍යාග ලැබීම් | |
| 255,276.18 | ආයෝජනයන් හි වැඩිවීම | (1,329,527.50) |
| - | පාරිතෝෂික ගෙවීම් | |
| (6,638.00) | පුනරුත්තාපන වියදම | (60,656.53) |
| **(450,111.22)** | **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය** | **(2,525,190.67)** |
| | **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ලද මුදල් ප්‍රවාහයන්** | |
| 300,000.00 | ප්‍රාග්ධන ප්‍රතිපාදන | 1,250,000.00 |
| - | තොරතුරු තාක්ෂණ ප්‍රතිපාදන | |
| - | පරිත්‍යාගයන් | |
| **300,000.00** | **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය** | **1,250,000.00** |
| **580,320.74** | මුදල් හා මුදල් හා සමාන දෑ හි ශුද්ධ වැඩිවීම/(අඩුවීම) | **16,674.82** |
| **582,236.04** | වර්ෂය ආරම්භයේ මුදල් හා මුදල් හා සමාන දෑ | **1,162,556.78** |
| **1,162,556.78** | වර්ෂය අවසානයේ මුදල් හා මුදල් හා සමාන දෑ | **1,179,231.60** |

## පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය
## 2010.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
## ස්කන්ධ වෙනස්වීම් ප්‍රකාශනය

(රු.)

| | ප.උ.ඉ. ආයතනයේ පොදු සංචිතය | වෙනත් අරමුදල් | වැය කළ ප්‍රාග්ධන ප්‍රතිපාදන | වැය නොකළ ප්‍රාග්ධන ප්‍රතිපාදන | මුළු වටිනාකම |
|---|---|---|---|---|---|
| 31/12/2009 දිනට ශේෂය | **(447,689)** | **4,675,461** | **2,514,504** | **(2,064)** | **6,740,211** |
| පූර්ව වර්ෂ ගැලපීම් | 192,376 | | 41,319 | (41,319) | 192,376 |
| වර්ෂය තුළ වැයකළ ප්‍රාග්ධන ප්‍රතිපාදන | 6,638 | | 149,272 | (155,910) | - |
| වර්ෂය තුළ ලද/(වියදම්කළ) අරමුදල් | | (668,375) | | 300,000 | (368,375) |
| | | | | | - |
| වර්ෂය තුළ ලද පරිත්‍යාගයන් | | | | | - |
| ප්‍රාග්ධන අරමුදල් ක්‍රමක්ෂය | | | (512,304) | | (512,304) |
| පුනරුත්තාපන පුනරාවර්තන වියදම | (6,638) | | | | (6,638) |
| කාලච්ඡේදය සඳහා අතිරික්තය/(ඌනතාව) | 826,455 | | | | 826,455 |
| 31/12/2010 දිනට ශේෂය | **571,142** | **4,007,086** | **2,192,790** | **100,708** | **6,871,725** |
| පූර්ව වර්ෂ ගැලපීම් | | | | | - |
| වර්ෂය තුළ වැයකළ ප්‍රාග්ධන ප්‍රතිපාදන | (108,457) | | 968,309 | (1,028,966) | (169,114) |
| වර්ෂය තුළ ලද/(වියදම්කළ) අරමුදල් | | (47,800) | | 1,250,000 | 1,202,200 |
| | | | | | - |
| වර්ෂය තුළ ලද පරිත්‍යාගයන් | | | | | - |
| ප්‍රාග්ධන අරමුදල් ක්‍රමක්ෂය | | | (634,239) | | (634,239) |
| පුනරුත්තාපන පුනරාවර්තන වියදම | 108,457 | | | | 108,457 |
| කාලච්ඡේදය සඳහා අතිරික්තය/(ඌනතාව) | 1,710,021 | | | | 1,710,021 |
| 31/12/2011 දිනට ශේෂය | **2,281,163** | **3,959,286** | **2,526,860** | **321,742** | **9,089,050** |

## පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය

*31.12.2011 දිනට ශේෂ පත්‍රය*

| | හර | බැර |
|---|---|---|
| මුදල් පොතේ අවසාන ශේෂය | 1,179,231.60 | - |
| උත්සව අත්තිකාරම් | 2,000.00 | - |
| උපචිත වියදම් | - | 477,059.04 |
| ගබඩා අත්තිකාරම් | 94,960.23 | - |
| ශිෂ්‍ය ලියාපදිංචි ගාස්තු | - | 35,810.00 |
| අධ්‍යයන ගාස්තු | - | 1,043,440.00 |
| විභාග ගාස්තු | - | 81,000.00 |
| ණය සහ අත්තිකාරම්වලින් ලද පොලී ආදායම් | - | 6,332.92 |
| පොලී ආදායම් | - | 312,961.09 |
| අයදුම්පත් විකුණුම් ආදායම් | - | 97,000.00 |
| විවිධ ලැබීම් | - | 44,060.00 |
| පරිපූරක ගාස්තු | - | 12,540.00 |
| නිබන්ධන ගාස්තු | - | 182,870.00 |
| ප්‍රාග්ධන ප්‍රතිපාදන ක්‍රමක්ෂය | - | 634,238.92 |
| රජයේ ආධාර - පුනරාවර්තන වියදම් සඳහා ප්‍රතිපාදන | - | 3,187,000.00 |
| පුනරුත්තාපන වියදම් සඳහා ආධාර | - | 47,800.17 |
| පාරිතෝෂික | - | 256,600.50 |
| ප්‍රාග්ධන ගිණුම | - | 2,526,860.26 |
| වැය නොකළ මූලධන ප්‍රතිපාදන - පුනරුත්තාපන - ගොඩනැගිලි හා සවිකිරීම් | | - |
| වැය නොකළ මූලධන ප්‍රතිපාදන - පුනරුත්තාපන - යන්ත්‍රසූත්‍ර හා උපකරණ | | 35,000.00 |
| වැය නොකළ මූලධන ප්‍රතිපාදන - ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ | | 263,164.67 |
| වැය නොකළ මූලධන ප්‍රතිපාදන - පුස්තකාල පොත් හා වාර සඟරා | | 23,577.35 |
| ප.උ.ඉ.භා. ආයතන සංවර්ධන අරමුදල | - | 3,959,285.43 |
| වැටුප් හා වේතන - අධ්‍යයන | 197,510.00 | - |
| වැටුප් හා වේතන - අනධ්‍යයන | 847,200.32 | - |
| භාෂා දීමනාව | 7,326.29 | - |
| බාහිර කථිකාචාර්ය ගෙවීම් | 87,000.00 | - |
| අතිකාල දීමනා | 69,867.38 | - |
| විශේෂ දීමනාව - අධ්‍යන | 9,875.50 | - |
| විශේෂ දීමනාව - අනධ්‍යන | 42,346.11 | - |
| පර්යේෂණ දීමනාව | 18,825.00 | - |
| විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල - අධ්‍යයන | 29,004.38 | - |
| විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල - අනධ්‍යයන | 106,138.36 | - |
| විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප් අරමුදල - අධ්‍යයන | 6,960.00 | - |
| විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප් අරමුදල - අනධ්‍යයන | 44,634.19 | - |
| සේවක භාරකාර අරමුදල 3% - අධ්‍යයන | 7,192.88 | - |
| සේවක භාරකාර අරමුදල 3% - අනධ්‍යයන | 30,154.50 | - |
| වැඩ බැලීමේ ගෙවීම් | 206,119.02 | - |
| අධ්‍යයන දීමනා | 86,382.63 | - |

| | | |
|---|---|---|
| ජීවන වියදම් දීමනා - අධ්‍යයන | 22,200.00 | - |
| ජීවන වියදම් දීමනා - අනධ්‍යයන | 251,859.68 | - |
| ගමන් වියදම් - දේශීය | 41,511.00 | - |
| ලිපිද්‍රව්‍ය හා කාර්යාල අවශ්‍යතා | 345,385.45 | - |
| නිල ඇඳුම් දීමනාව | 3,752.89 | - |
| අනෙකුත් සැපයුම් | 20,392.23 | - |
| නඩත්තු - යන්ත්‍රසූත්‍ර හා උපකරණ | 116,194.40 | - |
| මුද්‍රණ හා ප්‍රචාරණ වියදම් | 248,407.04 | - |
| දූරකතන ගාස්තු | 55,869.86 | - |
| තැපැල් ගාස්තු | 51,143.00 | - |
| විදුලි ගාස්තු | 152,943.60 | - |
| ජල සහ නිවාස ගාස්තු | 27,056.40 | - |
| දුම්රිය වාර ප්‍රවේශ පත්‍ර ගාස්තු | 4,500.00 | - |
| සංග්‍රහ වියදම් | 61,663.00 | - |
| බැංකු ගාස්තු | 8,088.92 | - |
| විශේෂ සේවා - කළමණාකරන කමිටු වියදම් | 247,400.00 | - |
| විභාග වියදම් | 79,890.00 | - |
| අනෙකුත් පුනරාවර්තන වියදම් | 75,010.08 | - |
| විශේෂ සේවා - වෘත්තීය හා අනෙකුත් ගෙවීම් | 166,354.63 | - |
| වැඩමුළු සහ සම්මන්ත්‍රණ | 14,237.00 | |
| පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා අරමුදල | - | 571,142.00 |
| ගෘහ භාණ්ඩ හා සවිකිරීම් | 519,850.61 | - |
| පුස්තකාල පොත් හා වාර සඟරා | 1,426,422.65 | - |
| කාර්යාල උපකරණ | 1,183,657.00 | - |
| පරිගණක හා උපාංග | 1,153,327.72 | - |
| ක්ෂය වෙන්කිරීම් - ගෘහ භාණ්ඩ හා සවිකිරීම් | - | 122,463.00 |
| ක්ෂය වෙන්කිරීම් - පුස්තකාල පොත් | - | 561,724.90 |
| ක්ෂය වෙන්කිරීම් - කාර්යාල උපකරණ | - | 552,843.20 |
| ක්ෂය වෙන්කිරීම් - පරිගණක හා උපාංග | - | 519,366.62 |
| කෙටිකාලීන ආයෝජන | 5,826,360.32 | - |
| විවිධ ණය ගැතියෝ | - | 50.00 |
| ලැබිය යුතු පොලී ආදායම් ගිණුම | 71,326.40 | - |
| සේවක ණය | 3,060.00 | - |
| ආපදා ණය | 163,505.00 | - |
| වාහන ණය | 5,100.00 | - |
| විශේෂ අත්තිකාරම් | 250.00 | - |
| ලංසු බැඳුම්කර | - | 7,500.00 |
| ආපසු ගෙවියයුත තැන්පතු | - | 4,500.00 |
| විවෘත විශ්වවිද්‍යාලයට ගෙවිය යුතු ශේෂය | - | 33,117.14 |
| කොන්ත්‍රාත් මත රැඳවුම් | - | 4,776.65 |
| ස්ථාවර වත්කම් ක්ෂය | 634,238.92 | - |
| පාරිතෝෂික වෙන්කිරීම | - | 497,402.50 |
| රජයේ ආධාර - පුනරුත්තාපන පුනරාවර්තන | - | 60,656.53 |
| 101-2601 ගොඩනැගිලි (පුනරාවර්තන) | 108,456.70 | - |
| **Total** | **16,162,142.89** | **16,162,142.89** |

## 9. විගණකාධිපතිවරයාගේ වාර්තාව

# විගණකාධිපති දෙපාර්තමේන්තුව
**கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்**
**AUDITOR GENERAL'S DEPARTMENT**

| | | |
|---|---|---|
| මගේ අංකය<br>**எனது இல.**<br>**My No** | සීර්/එච්/පීජ්අයිර්/එෆ්ඒ/11 | |
| ඔබේ අංකය<br>**உமது இல**<br>Your No. | | |
| දිනය<br>**திகதி**<br>Date | 2012 ජුලි 10 දින | |

අධ්‍යක්ෂ,
ඉංග්‍රීසි භාෂාව පිළිබඳ පශ්චාත් උපාධි ආයතනය.

**ඉංග්‍රීසි භාෂාව පිළිබඳ පශ්චාත් උපාධි ආයතනයේ 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 108(2) වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.**

---

ඉංග්‍රීසි භාෂාව පිළිබඳ පශ්චාත් උපාධි ආයතනයේ 2011 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරු වල සාරාංශයකින් සමන්විත 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2005 අංක 04 දරන ඉංග්‍රීසි භාෂාව පිළිබඳ පශ්චාත් උපාධි ආයතන නියමාවලිය සහ 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 108(1) හා 111 වගන්ති සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3), (4) සහ (7) උපවගන්ති සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්වවිද්‍යාල පනතේ 108(2) වගන්තිය සහ මුදල් පනතේ 13(7) (ඒ) වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව නිකුත් කෙරේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය යැයි කළමනාකරණය විසින් තීරණය කරනු ලබන අභ්‍යන්තර පාලනය කළමනාකරණයේ වගකීම වේ.


අංක 306/72 පොල්දුව පාර, බත්තරමුල්ල , ශ්‍රී ලංකාව
இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை இலங்கை
No.306/72, Polduwa Road, Battaramulla , Sri Lanka

දුරකථනය / தொலைபேசி / Telephone: 2887028 -34
ෆැක්ස් අංකය / பக்ஸ் இல / Fax No.: 2887223
ඉලෙක්ට්‍රොනික් තැපැල් / ஈ- மெயில் / E-mail.: oaggov@sltnet.lk

1.3 විගණකගේ වගකීම

---------------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිත වලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම් වලට උපකාරී වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීමද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත්වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.4 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම

---------------------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

2. මූල්‍ය ප්‍රකාශන

2.1 තත්ත්වාගණනය කල මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, 2011 දෙසැම්බර් 31 දිනට ඉංග්‍රීසි භාෂාව පිළිබඳ පශ්චාත් උපාධි ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ මුළු ආයෝජන ආදායම රු.295,352 ක් වුවත් ආයතනයේ ගිණුම් වල එය රු.312,961 ක් ලෙස රු.17,609 ක් වැඩියෙන් දක්වා තිබූ අතර මේ හේතුවෙන් වර්ෂයේ අතිරික්තයද එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) 2011 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු පොළී ආදායම රු.53,718 ක් වුවත් ගිණුම් වල එය රු.71,276 ක් ලෙස රු.17,558 ක් වැඩියෙන් දක්වා තිබූ අතර මේ හේතුවෙන් ජංගම වත්කම්ද එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

### 2.2.2 නීතී, රීතී, රෙගුලාසි හා කලමනාකරණ තීරණ වලට අනුකූල නොවීම

විගණනයේදී නිරීක්ෂණය වූ අනුකූල නොවීම් අවස්ථා පහත දැක්වේ.

| | නීතී,රීතී,රෙගුලාසි හා කලමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 2005 අංක 4 දරන ඉංග්‍රීසි භාෂාව පිළිබඳ පශ්චාත් උපාධි ආයතන නියමාවලිය<br>6 වගන්තිය | අධ්‍යක්ෂ ධූරය 2011 මාර්තු 01 දින සිට පුරප්පාඩු වී තිබූ නමුත් නව අධ්‍යක්ෂකවරයෙකු බඳවා ගැනිම සමාලෝචිත වර්ෂය අවසානය තෙක්ම සිදුකර නොතිබුණි. |
| (ආ) | 1997 ඔක්තෝබර් 17 දිනැති විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අංක 720<br>3.1 ඡේදය | වැඩ බැලීමේ පත්වීම්වල උපරිම කාල සීමාව මාස 06 ක් වුවද ආයතනයේ අනධ්‍යයන තනතුරු වූ අධ්‍යක්ෂ, ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරි, සහකාර මූල්‍යාධිකාරි යන තනතුරු වල රාජකාරි මාස 06 ඉක්මවූ වැඩබැලීමේ පත්වීම් මගින් ඉටුකර තිබුණි . |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂයේ ආයතනයේ වැඩ කටයුතුවල මෙහෙයුම් ප්‍රතිඵලය, රජයේ ප්‍රදාන සැලකිල්ලට ගැනිමට පෙර රු.1,538,650 ක ඌනතාවයක් වූ අතර ඉකුත් වර්ෂය සඳහා අනුරූපී ඌනතාවය රු.1,928,183 ක් විය. සමාලෝචිත වර්ෂය සඳහා ඌනතාවය පුනරාවර්තන වියදම් සඳහා රජයේ ප්‍රදාන වශයෙන් ලැබී තිබූ රු.3,187,000 ක් හා පුනරාවර්තන පුනරුත්ථාපනය සඳහා ලැබී තිබූ රු.60,656 ක ප්‍රදාන සැලකිල්ලට ගැනිමෙන් පසු රු.1,709,006 ක අතිරික්තයක් බවට පත්ව තිබුණි. එලෙසම ඉකුත් වර්ෂය සඳහා ඌනතාවයද එම වර්ෂයේ ලැබී තිබූ පුනරාවර්තන වියදම් සඳහා වූ රු.2,748,000 ක රජයේ ප්‍රදානය සහ පුනරාවර්තන පුනරුත්ථාපනය සඳහා වූ රු.6,635 ක රජයේ ප්‍රදානය සැලකිල්ලට ගැනිමෙන් පසු රු. 826,488 ක අතිරික්තයක් බවට පත්ව තිබුණි.

3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

---

රජයේ පුනරාවර්තන ප්‍රදාන හා රජයේ පුනරාවර්තන පුනරුත්ථාපන ප්‍රදාන ලෙස රු.3,247,656 ක මුදලක් ලැබී තිබුණු අතර සමාලෝචිත වර්ෂය තුළ ආයතනය විසින් දරන ලද මුළු පුනරාවර්තන වියදම රු. 4,035,444 ක් විය.

4. මෙහෙයුම් සමාලෝචනය

---

4.1 කාර්ය සාධනය

---

2006 වර්ෂයේ සිට 2011 වර්ෂය දක්වා ශාස්ත්‍රපති උපාධිය සඳහා ලියාපදිංචි වී ඇති මුළු ශිෂ්‍ය සංඛ්‍යාව 100 ක් වන අතර 2011 වර්ෂය අවසන් වන විට උපාධිය සම්පූර්ණ කර ඇති ශිෂ්‍ය සංඛ්‍යාව 07 ක් පමණක් විය. 2011 වර්ෂය අවසන් වන විට තව දුරටත් පාඨමාලාවේ රැඳී සිටින ශිෂ්‍ය සංඛ්‍යාව 37 ක් විය. ඒ අනුව පාඨමාලාව හැරගිය සංඛ්‍යාව 56 ක් විය.

4.2 ප්‍රතිපාදන උපයෝජනය

---

2008 වර්ෂයේදී යන්ත්‍ර හා උපකරණ පුනරුත්ථාපනය සඳහා ප්‍රතිපාදනය කර තිබූ රු.35,000 ක් සමාලෝචිත වර්ෂය අවසානය තෙක් ප්‍රයෝජනයට ගෙන නොතිබුණි.

4.3 කාර්ය මණ්ඩල පරිපාලනය

---

ආයතනයේ අධ්‍යයන කාර්ය මණ්ඩලයේ තනතුරු 03 න් පුරප්පාඩු තනතුරු 02 ක් සමාලෝචිත වර්ෂය තුළද පුරවා නොතිබුණි.

5 ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

---

5.1 සංයුක්ත සැලැස්ම

---

ආයතනය විසින් පිළියෙල කර තිබූ 2009 - 2012 වර්ෂ සඳහා වූ සංයුක්ත සැලැස්ම කාලානුරූපීව සමාලෝචනය කර යාවත්කාලීන කර නොතිබුණි.

5.2 ක්‍රියාකාරී සැලැස්ම

-----------------------

(අ) 2011 වර්ෂය සඳහා වූ ක්‍රියාකාරී සැලැස්ම සංයුක්ත සැලැස්ම හා සමගාමී නොවූ අතර 2011 වර්ෂයේ ආරම්භ කිරීමට නියමිතව තිබූ ඉංග්‍රීසි ඉගැන්වීම් පිළිබඳ පශ්චාත් උපාධි සහතිකපත්‍ර පාඨමාලාව ක්‍රියාකාරී සැලැස්මට ඇතුලත් කර නොතිබුණි.

(ආ) ක්‍රියාකාරී සැලැස්ම අනුව සමාලෝචිත වර්ෂය තුළ ඉටුකල යුතුව තිබූ ක්‍රියාකාරකම් වලින් ක්‍රියාකාරකම් 04 ක් නියමිත කාලපරාසයන් තුළදී ඉටුකර නොතිබුණි.

5.3 අභ්‍යන්තර විගණනය

-------------------------

සමාලෝචිත වර්ෂය තුළ ආයතනයේ ක්‍රියාකාරකම් 100% ක් පරික්ෂාවට ලක්කරන බවට අභ්‍යන්තර විගණන වැඩසටහනේ දක්වා තිබූ නමුත් වර්ෂය තුළ කිසිදු අභ්‍යන්තර විගණන පරික්ෂාවක් ආයතනය තුළ සිදු කර නොතිබුණි.

5.4 අයවැය ලේඛනමය පාලනය

----------------------------------

අයවැය හා තථ්‍ය සංඛ්‍යා අතර සැලකිය යුතු විචලනයන් නිරික්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබුණු බව නිරික්ෂණය විය.

5.5 වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කිරීම

--------------------------------------------------------

1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනතේ 110 වගන්තිය අනුව ආයතනයේ 2010 වර්ෂයේ වාර්ෂික වාර්තාව 2012 මාර්තු 31 දක්වා පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

6. පද්ධති හා පාලන

---------------------

පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුකල යුතුවේ.

(අ) කාර්ය මණ්ඩල බඳවා ගැනීම්.

(ආ) අයවැය

එච්. ඒ.එස්. සමරවීර

විගණකාධිපති

## 10. විගණකාධිපතිවරයාගේ වාර්තාවට පිළිතුරු

Postgraduate Institute of English
The Open University of Sri Lanka
P.O. Box 21
Nawala
Nugegoda

Telephone: 2825805, 2825806, 2881527, 2881532, 2853777
Director: Ext:. 528. Assistant Registrar:: Ext 527

---

2012 අගෝස්තු 03

එච්. ඒ. එස්. සමරවීර මහතා,
විගණකාධිපති,
විගණකාධිපති දෙපාර්තමේන්තුව,
අංක 306/72,
පොල්දූව පාර,
බත්තරමුල්ල.

මහත්මයාණෙනි,

**<u>ඉංග්‍රීසි භාෂාව පිළිබඳ පශ්චාද් උපාධි ආයතනයේ 2011 දෙසැම්බර් මස 31 වන දිනෙන් අවසන් වන වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 108(2) වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 13(7) (ඒ) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව</u>**

ඉහත කරුණ සම්බන්ධයෙන් ඔබගේ 2012 ජූලි 10 දිනැති ලිපිය සම්බන්ධයෙනි.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

**1.3 විගණකගේ වගකීම**

**1.4 තත්වගණනය කළ විගණන මතය සඳහා පදනම**

**2 මූල්‍ය ප්‍රකාශන**

**2.1 තත්වගණනය කළ මතය**

**2.2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.2.1. ගිණුම්කරණ අඩුපාඩු**

**2.2.2. නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

**නීති රීති රෙගුලාසි හා**
**කළමනාකරණ තීරණවලට අදාළව**

**(අ) 2005 අංක 04 දරණ පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතන පනත 6 කොටස**

පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ අධ්‍යක්ෂ ධූරය 2011 මාර්තු මස 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි පුරප්පාඩු වූ අතර එය 2011 මාර්තු 14 යනුවෙන් සඳහන් වීම

අඩුපාඩුවකි. පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ කළමනාකරණ මණ්ඩලයේ තීරණය අනුව 2010 ඔක්තෝම්බර් මස 17 දින අධ්‍යක්ෂ තනතුර සඳහා අයදුම්පත් කැඳවන ලදී. ඒ අනුව ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය පාලක සභාව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ එකඟතාව මත මහාචාර්ය අර්ජුන පරාක්‍රම මහතා 2011 මාර්තු මස 14 දින සිට ක්‍රියාත්මක වන පරිදි පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ අධ්‍යක්ෂ තනතුරට පත් කරනු ලැබීය. 2011 මාර්තු මස 08 වෙනි දින ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය උපකුලපතිවරයාගේ අත්සනින් යුතුව එම පත්වීමේ ලිපිය නිකුත් කෙරිණි. මහාචාර්ය අර්ජුන පරාක්‍රම මහතා අදාළ තනතුරෙහි වැඩ බාර නොගත් හෙයින් උපකුලපතිවරයා 2011 මැයි 13 වන දින සිහිකැඳවීමේ ලිපියක් ද යවා තිබුණේ ඔහු එම තනතුර බාර ගන්නේ ද නැද්ද යන්න පිළිබඳව විමසමිනි. උපකුලපතිවරයාගේ ලිපියට පිළිතුරු වශයෙන් මහාචාර්ය අර්ජුන පරාක්‍රම මහතා 2011 මැයි 23 දින පිළිතුරු ලිපියක් එවමින් පවසා තිබුණේ වැඩ බාර ගැනීම සඳහා අමතර කාලයක් (2011 ඔක්තෝම්බර් මස දක්වා) අවශ්‍ය වන බවයි.

ඔහුගේ ඉල්ලීම සලකා බලා ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය පාලක සභාව 2011 මැයි මස 27 දින පැවැති එහි 362 වෙනි පාලක සභා රැස්වීමේ දී ඔහුට වැඩ බාර ගැනීම සඳහා අමතර කාලයක් 2011 ජුනි මස 14 වෙනි දින තෙක් ලබාදීමට තීරණය කළ අතර ඒබ ව උපකුලපතිතුමා විසින් ඔහුගේ 2011 ජුනි මස 03 වෙනි දින දරන ලිපිය මගින් මහාචාර්ය අර්ජුන පරාක්‍රම මහතා වෙත දන්වන ලදී. ඊට පිළිතුරු වශයෙන් මහාචාර්ය අර්ජුන පරාක්‍රම මහතා විසින් ඔහුගේ 2011 ජුනි මස 14 දිනැති ලිපිය මගින් තවත් මාස තුනක කාලයක් ඉල්ලා සිටින ලදී.

2011 ජුනි මස 24 දින පැවැති 363 වෙනි පාලක සභා රැස්වීමේ දී ඒ අනුව නැවත අධ්‍යක්ෂ තනතුර සඳහා අයදුම්පත් කැඳවීමට

තීරණය වූයේ ස්ථිර අධ්‍යක්ෂවරයෙකුගේ සේවය ආයතනයට අවශ්‍ය නිසාවෙනි.

මේ හා සමගාමීවම අධ්‍යක්ෂ තනතුර සඳහා නැවත අයදුම්පත් කැඳවීමට අවශ්‍ය පියවර ගැනිණ. ඒ අනුව 2011 ජූලි මස 17 වෙනි දිනැතිව නැවත බඳවා ගැනීම සඳහා වන දැන්වීම පළ කෙරිණි. 2011 අගෝස්තු මස 26 දින අයදුම්පත් බාර ගන්නා අවසන් දිනය වූ අතර ඒ අනුව තෝරා ගන්නා ලද අපේක්ෂකයන්ගේ නම් ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය පාලක සභාව වෙත ඉදිරිපත් කෙරිණි.

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය පාලක සභාවේ සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ඒකමතික තීරණය වූයේ අධ්‍යක්ෂ තනතුර සඳහා තෝරාගනු ලැබූ මහාචාර්ය අර්ජුන පරාක්‍රම මහතා මාසයක් ඇතුළත අදාළ පත්වීම බාර නොගත්තේ නම් ඊළඟ අයදුම්කරු ඒ සඳහා පත් කළ යුතු බවයි.

මහාචාර්ය අර්ජුන පරාක්‍රම මහතා උපකුලපතිවරයා වෙත එවන ලද පිළිතුරු ලිපියෙහි (2012 ජනවාරි 03 දිනැති) පත්වීම බාර ගැනීම සඳහා තවත් කාලයක් ඉල්ලා සිටීම හේතුවෙන් ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය පාලක සභාව සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මඟින් ගනු ලැබූ තීරණය ප්‍රකාරව ආචාර්ය එච්.වී.එම්. රත්වත්ත මිය 2012 මාර්තු මස 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ අධ්‍යක්ෂ ලෙස පත් කෙරිණි.

**(ආ) විශ්වවිද්‍යාල ප්‍රතිපදාන කොමිෂන් සභා චක්‍රලේඛ 720 (1997 ඔක්තෝම්බර් 17 දිනැති) චක්‍රලේඛය**

**3.1 ඡේදය**

ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරි, සහකාර මූල්‍යාධිකාරි යන තනතුරු පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ පරිපාලනයෙන් බැහැරව සිදු කෙරෙන පත්කිරීම් වේ. මෙම තනතුරු සඳහා බඳවා ගැනීම් සිදු කරනු ලබන්නේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මඟිනි. පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය මඟින් අවස්ථා කිහිපයක දී ම මෙම තනතුර පිරවීමේ අවශ්‍යතාව පිළිබඳව

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත දන්වනු ලැබ ඇත.

අධ්‍යක්ෂ තනතුර සඳහා පත් කිරීම
අධ්‍යක්ෂ තනතුර පිරවීම සම්බන්ධයෙන් අනුගමනය කරන ලද ක්‍රියාමාර්ගයන් පිළිබඳව සවිස්තර වාර්තාවක් 2.2.3(අ) පිළිතුරෙහි අන්තර්ගත කොට ඇත.

**3. මූල්‍ය සමාලෝචනය**

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ විගණන අංශය වෙත පැහැදිලි කිරීමක් ඉල්ලා ලිපියක් යවා ඇත්තේ රු. 1,538,650/- හිඟය ගණනය කර ඇත්තේ කෙසේද විමසමිනි.

**3.2 විශ්ලේෂණාත්මක මූල්‍ය සමාලෝචනය**

**4. මෙහෙයුම් සමාලෝචනය**

**4.1 කාර්ය සාධනය**

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ දූරස්ථ අධ්‍යාපන ක්‍රමය පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය මඟින් ද ක්‍රියාත්මක කරනු ලැබේ. දූරස්ථ අධ්‍යාපන ක්‍රමය මඟින් ශිෂ්‍යයන්හට ඔවුන්ගේ ස්ථානයේ සිට අධ්‍යයන ක්‍රමය මඟින් ශිෂ්‍යයන්හට ඔවුන්ගේ ස්ථානයේ සිට අධ්‍යයන කටයුතුවල නියළිය හැකිය. එහෙයින් කිසිදු ශිෂ්‍යයෙක් පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ අධ්‍යයන පාඨමාලාව හැරගිය අයෙකු ලෙස මෙහි දී සැලකිය හැකි නොවේ. (ඔවුන්ගේ අධ්‍යයන කටයුතුවලින් තාවකාලිකව ඈත් වුවද)

2006/2007 අධ්‍යයන වර්ෂයේ ලියපදිංචි වී ඇති ශිෂ්‍යයන්හට නැවත 2011/2012 අධ්‍යයන වර්ෂය සඳහා හිඟ ගාස්තු ගෙවීමෙන් ඔවුන්ගේ ලියාපදිංචිය අලුත් කරවා ගත හැකිය. (මෙහිදී 2007/2008, 2008/2009, 2009/2010 සහ 2010/2011 යන වර්ෂයන් සඳහා ලියාපදිංචිය අලුත් කරවා ගැනීම නොසලකා හැරිය හැකිය.)

ඒ අනුව එක් මියගිය ශිෂ්‍යයෙකු හැර මෙම විගණන විමසුමෙන් පෙන්වා දෙන ලද අනෙකුත් ශිෂ්‍යයන් 56 දෙනා පාඨමාලාව හැරගිය ශිෂ්‍යයන් ලෙස සැලකිය හැකි නොවේ. මෙම ශිෂ්‍යයන් අතුරින් බොහොමයක් දෙනා අපහට දන්වා ඇත්තේ ඔවුන්ගේ පවත්නා සෞඛ්‍යමය අඩුපාඩුකම්, පවුල් තත්ත්වය වෙනස් වීම, ස්ථාන මාරුවීම් ආදී හේතුමත මේ අවස්ථාවේ අධ්‍යයන වැඩසටහන් සඳහා සහභාගි විය නොහැකි බවයි. නමුත් ඔවුන් තුළ අධ්‍යයන කටයුතු ඉදිරියට කරගෙන යාම පිළිබඳව අදහසක් ඇති බව ද දන්වා ඇත.

## 4.2 ප්‍රතිපාදන ඌණ උපයෝජනය

මේ සම්බන්ධයෙන් මහා භාණ්ඩාගාරයෙන් ඉහත සඳහන් කළ භාවිත නොකළ මුදල් ආපසු යැවීමේ ක්‍රමවේදය පිළිබඳව උපදෙස් ඉල්ලා දැනුම්දීමක් කොට ඇත.

## 4.3 කාර්ය මණ්ඩල පරිපාලනය

2011 වර්ෂය ආරම්භයේ සිට පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය විසින් පවත්නා අධ්‍යයන කාර්ය මණ්ඩල පුරප්පාඩු දෙක පිරවීම සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ලැබ ඇත. ඒ අනුව 2011 ජනවාරි මස 30 වෙනි දින අදාළ පුවත්පත් දැන්වීම පළ කෙරිණි. තවද විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අංක 233 අනුව තේරීම් කමිටුවක් ද පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ කළමනාකරණ මණ්ඩලය විසින් පත් කෙරිණි.

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අංක 233(i) ඡේදය අනුව තේරීම් කමිටුවේ එක් සාමාජිකයෙකු විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නම් කරනු ලැබිය යුතුය. ඒ අනුව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව 2011 අප්‍රේල් 07 දිනැති ලිපිය මඟින් එම සාමාජිකයා නම් කෙරිණි.

සම්මුඛ පරීක්ෂණය සඳහා යෝජිත දිනය විශ්වවිද්‍යාලයීය අධ්‍යයන කාර්ය මණ්ඩලයේ වෘත්තීය සමිති ක්‍රියාමාර්ග හේතුවෙන් කල් දැමීමට සිදුවිය. ඒ අනුව නව සාමාජිකයින් දෙදෙනෙකු පත් කරවා ගැනීමට සිදුවිය. මේ හා සමගාමීව විවෘත විශ්වවිද්‍යාලයීය පාලක සභාව විසුරුවා හැරීම නිසා කළමනාකරණ මණ්ඩල නියෝජනය කරමින් තේරීම් කමිටුව සඳහා නියෝජිතයෙකු නැවත නව කළමනාකරණ මණ්ඩලයෙන් නම් කිරීමට සිදුවිය.

2011 අගෝස්තු මස දී තේරීම් කමිටුව රැස් වූ අතර එම කමිටුවේ තීරණය වූයේ අපේක්ෂකයන් අතුරින් සම්මුඛ පරීක්ෂණයට සහභාගි වූ එකම අපේක්ෂකයා සුදුසු බවයි.

එම තීරණය පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ කළමනාකරණ මණ්ඩලය මඟින් ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය පාලක සභාව වෙත 2011 ඔක්තෝම්බර් මස දී යොමු කරවන ලදී. 2011 නොවැම්බර් මස 01 දිනැතිව ලේඛකාධිකාරී විසින් නිකුත් කරන ලද ලිපියට අනුව ඉහත සඳහන් කරන ලද අපේක්ෂකයාගේ නම ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය පාලක සභාව විසින් ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය තනතුර සඳහා නිර්දේශ කොට තිබුණි. ඒ අනුව ඉහත සඳහන් නිර්දේශයන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතිය සඳහා යොමු කෙරිණි.

අධ්‍යයන කාර්ය මණ්ඩල පුරප්පාඩු පිරවීම පිළිබඳ අවශ්‍ය ක්‍රියාමාර්ගයන් පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය විසින් වර්ෂය ආරම්භයේ සිටම අරඹා තිබුණි. මෙය ප්‍රමාද වීමට හේතු වූයේ විශ්වවිද්‍යාලයීය අධ්‍යයන කාර්ය මණ්ඩලයේ වෘත්තීය සමිති ක්‍රියාමාර්ගයන් සහ ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය පාලක සභාව නියෝජනය කරන කළමනාකරණ මණ්ඩලයේ සාමාජිකයන් වෙනස්වීම හේතුකොට ගෙනය.

## 5. වගකීම සහ යහපාලනය

### 5.1 සංයුක්ත සැලැස්ම

2011/2012 වර්ෂය සඳහා සංයුක්ත සැලැස්ම යාවත්කාලීන කොට ඉදිරිපත් කරන ලදුව කළමනාකරණ මණ්ඩල අනුමැතිය ලබා ගන්නා ලදී. (පිළිතුර සමග අංක CE/H/PGIE/11/A.Q. 04 දරන පිටපත ඉදිරිපත් කරනු ලැබේ.)

### 5.2 ක්‍රියාකාරී සැලැස්ම

(අ) ඉංග්‍රීසි සාහිත්‍යය ඉගැන්වීම පිළිබඳ පශ්චාද් උපාධි සහතික පත්‍රයක් ප්‍රදානය නොකිරීමට තීරණ වූ අතර වර්තමානයට සරිලන පරිදි විෂය මාලාව යාවත්කාලීන කිරීමට තීරණය විය. එසේම රටෙහි අවශ්‍යතාව සලකා දෙවන භාෂා පරිසරය තුළ ඉංග්‍රීසි සාහිත්‍යය ඉගැන්වීම පිළිබඳ පශ්චාද් උපාධි ඩිප්ලෝමා/ශාස්ත්‍රපති උපාධිය පිරනැමීම පිළිබඳව අවශ්‍ය වන අනුමැතීන් අදාළ මණ්ඩලයන්ගෙන් ලබා ගැනීමේ ක්‍රියාවලියෙහි පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය නිරතව සිටී.

මෙම යෝජනාවලිය පිළිබඳ අධ්‍යයන මණ්ඩලයේ අනුමැතිය 2012 මාර්තු මස දී ලබා ගැනිණ.

(ආ) පහත සඳහන් තත්ත්වයන්ට අදාළව අනුගමනය කරන ලද ක්‍රියාමාර්ගයන්

**(I) අධ්‍යක්ෂ පත්කිරීම**

මෙය පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ පරිපාලනයෙන් බැහැර කටයුත්තකි. මේ සම්බන්ධයෙන් විගණන විමසුම්වලට අදාළ පිළිතුරු යටතේ අංක CE/H/PGIE/11/A.Q. 03 යටතේ සවිස්තර වාර්තාවක් ඉදිරිපත් කොට ඇත.

**(II) ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය තනතුරු සඳහා පත්කිරීම**

මෙය ද පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ පරිපාලනයෙන් බැහැර වූවකි. මේ සම්බන්ධයෙන් සම්පූර්ණ විස්තර විගණන විමසුම් සඳහා පිළිතුරු යටතේ අංක CE/H/PGIE/11/A.Q. 03 යටතේ ඉදිරිපත් කොට ඇත.

**(III) පරිගණක යෙදවුම් සහකාර සහ පොත් තබන්නා තනතුරු සඳහා අනුමැතිය ලබා ගැනීම**

ඉහත සඳහන් තනතුරු දෙක සඳහා විශ්වවිද්‍යාලයීය ප්‍රතිපාදන කොමිෂන් සභා අනුමැතිය ලබා ගැනීම පිණිස 2009 ඔක්තෝම්බර් 30 සහ 2010 ඔක්තෝම්බර් 27 දිනැතිව ලිපි යවා ඇත.

තව ද එම තීරණය පිළිබඳව සිහි කැඳවීමේ ලිපි 2012 ජනවාරි 20 දිනැතිව සහ 2012 මාර්තු 08 දිනැතිව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපති වෙත යවා ඇත.

**(IV) ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී පත්කිරීම**

මෙය පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ පාලනයෙන් බැහැර වූවකි. මේ සම්බන්ධයෙන් සවිස්තර වාර්තාවක් විමසුම් අංක CE/H/PGIE/11/A.Q. 03 යටතේ පිළිතුරු අංක 03 යටතේ දක්වා ඇත.

**5.3 අභ්‍යන්තර විගණනය**

පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ අභ්‍යන්තර විගණන කටයුතු ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර විගණන අංශය විසින් මෙහෙය වනු ලැබේ. 2011 අප්‍රේල් මස 01 දින සිට අභ්‍යන්තර විගණක තනතුර පුරප්පාඩු වීම නිසා අදාළ කාර්යයන් තාවකාලික සහකාර අභ්‍යන්තර විගණකවරයෙකු විසින් ඉටු කිරීම නිසා අභ්‍යන්තර විගණන අංශයට ප්‍රමාණවත් විගණනයක් කිරීමට හැකියාව නොතිබුණි.

**5.4 අයවැය පාලනය**

2011 සැප්තැම්බර් මස සිට කළමනාකරණ මණ්ඩලයේ සාමාජිකයන්ට ගෙවනු ලබන දීමනා අනපේක්ෂිත ලෙස ඉහළ දැමීම හේතුවෙන් සහ පුරප්පාඩු පිරවීම යන පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ පාලනයෙන් බැහැර වූ තත්ත්වයන් හේතුවෙන් ඇස්තමේන්තු ගත අයවැය සහ තථ්‍ය අයවැය අතර වෙනසක් දක්නට ලැබිණි.

2012 වර්ෂයේ දී ක්‍රියාකාරී කළමනාකරණ පාලන දර්ශකයක් ලෙස අයවැය යොදා ගනු ලැබිය හැකිය.

**5.5 වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කිරීම**

2010 වර්ෂයේ දී පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය වාර්ෂික වාර්තා සහ ගිණුම් නිසි කලට විගණකාධිපති දෙපාර්තමේන්තුව වෙත සහ අනෙකුත් අදාළ ආයතන වෙත (උසස් අධ්‍යාපන අමාත්‍යාංශය, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව, රාජ්‍ය ව්‍යාපාර පිළිබඳ පොදු කාරක සභාව) ඉදිරිපත් කිරීමට අවශ්‍ය පියවර ගනු ලැබ තිබුණි.

2011 ජුනි 10 දිනැතිව උසස් අධ්‍යාපන ලේකම් විසින් යොමු කරන ලද ලිපිය අනුව වාර්ෂික වාර්තා සහ ගිණුම් පිළියෙල කිරීම සඳහා නව ආකෘතියක් හඳුන්වා දෙනු ලැබ ඇත.

සලකා බලන වර්ෂය පුරා ආයතනයේ ප්‍රධාන පරිපාලන තනතුරු තුන අර්ධ කාලීන වැඩබලන කාර්ය මණ්ඩලයක් මඟින් ක්‍රියාත්මක වීම හේතුවෙන් සංශෝධිත ආකෘතිය අනුව වාර්ෂික වාර්තා සහ ගිණුම් සකසා ඉදිරිපත් කිරීමේ ප්‍රමාදයක් ඇති විය.

පසුව අදාළ අංශයන් වෙත වාර්ෂික වාර්තා සහ ගිණුම් ඉදිරිපත් කිරීම සඳහා (නව ආකෘතියට අනුව සකසන ලද වාර්ෂික වාර්තා සහ ගිණුම් 2012 මාර්තු මස 26 දින පැවති කළමනාකරණ මණ්ඩලයට ඉදිරිපත් කොට එහි අනුමැතිය සහිතව ඉදිරිපත් කිරීමට) කටයුතු යොදන ලදී.

උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ අනුමැතිය ලැබීමෙන් පසු මෙම වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට කටයුතු යොදනු ලැබේ.

**6. පද්ධති සහ පාලන**

**(අ) කාර්ය මණ්ඩලය බඳවා ගැනීම**

**(ආ) අයවැය**

අයවැය පාලනය සහ අධ්‍යයන කාර්ය මණ්ඩලය බඳවා ගැනීම සඳහා විශේෂ අවධානය යොමු කිරීමට කටයුතු යොදනු ලැබේ.

ආචාර්ය එච්.වී.එම්. රත්වත්ත
අධ්‍යක්ෂ/පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය